# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,182 — 1960 අගෝස්තු 12 වැනි සිකුරාද — 12.8.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 597 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | 588 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 603 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් ෂත් පිළිබඳ දැන්වීම් ... | 623 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 629 | විවිධ දැන්වීම් ... ... ... | 629 |


## තනතුරු – ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන් කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන් හිදී මිස අන් හැම අවස්ථාවකදීම අධ්‍යුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් සවකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

**(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු** වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් **නිදහස් කරනු ලැබෙත්.**

**සංලක්ෂ්‍යය.**—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබූවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුඡේදයන්ට අනුකූල ව ආදී ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

**5. අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදාතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරන ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## ගම්බද උසාවි සභාපති තනතුරු

උතුරු සහ නැගෙනහිර පලාත්වල පුරප්පාඩු වී ඇති ගම්බද උසාවි සභාපති තනතුරු පිරවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව අදහස් කර සිටී. ලාංකික නීතිඥවරුන්ගෙන් යථෝක්ත තනතුරු සඳහා ඉල්ලුම්පත් භාරගනු ලැබේ.

ඉල්ලුම් පත් ලියා එවිය යුත්තේ කොළඹ 12, තැ. පෙ. 573 අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ගෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රවලය. 1960 සැප්තැම්බර මස 5 වැනිදා හෝ ඊට කලින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්තැන වෙත ලැබෙන ලෙස ඉල්ලුම්පත් එවිය යුතුය. තෝරාගනු ලැබූ අයදුම්කරුවාට වැටුප් ගෙවනු ලබන්නේ රුපියල් 180 වාර්ෂික වැඩිවීම් 8 කින් හා රුපියල් 360 වාර්ෂික වැඩිවීම් 8 කින් ද රුපියල් 4,980ක් ලැබීමටත් රුපියල් 6,240ක් ලැබීමටත් පෙර කාර්යක්ෂමතා කඩයිම් වලින් ද සමන්විත වූ වර්ෂයකට රුපියල් 4,080න් පටන්ගෙන වර්ෂයකට රුපියල් 8,400 තෙක් නගින වැටුප් ක්‍රමයක් අනුවය. ආණ්ඩුවෙන් අනුමත කරන ලද නියෝගවලට හා ගණන් ප්‍රමාණවලට අනුකූලව ප්‍රවාහන දීමනාවක් ද ගෙවනු ලැබේ. නිවාඩු හා සෙසු සේවා කොන්දේසි අදාල වන්නේ රාජ්‍යසේවාවට බැඳෙන නවකයන් සම්බන්ධයෙන් වූ රෙගුලාසි අනුවය. මේ තනතුරු දැරීමට සෞඛ්‍යය අතින් තමා යෝග්‍ය බැව් ඔප්පුකිරීමට තෝරාගනු ලැබූ අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය. එසේම දිවයිනේ වෙන ඕනෑම ගම්බද උසාවියක සභාපති වශයෙන් මාරු කරනු ලැබීමටද ඔවුන් යටත් විය යුතුය. පත්වීම් පරීක්ෂණාත්මක කාල පරිච්ඡේදයකට ද යටත් වන්නේ ය.

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන් ඒ පරීක්ෂණයට පැමිණිය යුත්තේ සවකීය වියදමිනි.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 අගෝස්තු මස 1 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ—12.

---

## රේගු දෙපාර්තමේන්තුව

### කයිට්ස්හි ලෝන්ච් වැඩපලේ ෆෝර්මන් තනතුර

රේගු දෙපාර්තමේන්තුවේ කයිට්ස්හි ලෝන්ච් වැඩපලේ ෆෝර්මන් තනතුරට ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. 1960 සැප්තැම්බර් මස 15 වැනි දිනට ප්‍රථම ඉල්ලුම්පත් මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—තනතුරට ඇති වාර්ෂික වැටුප් ප්‍රමාණය රු. 3,180—6 × 120 සහ 8 × 180—5,340 ක් වේ. කාර්යක්ෂමතා කඩඉම්ක් රු. 4,080 පෙර ඇත.

3. **සේවා කොන්දේසි.**—මේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ප්‍රථම වතාවේ දී පත්වීම තුන් අවුරුද්දක සෝදිසි කාල සීමාවක් පිටය. තෝරා ගනු ලැබූ අයදුම්කරු විසින් වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුයි.

4. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් ඇත්තන් විය යුතුයි :—

(අ) 1960 සැප්තැම්බර් මස 15 වැනි දිනට අවුරුදු 35 කට අඩු හෝ 45කට වැඩි නොවීම. මේ වයස් සීමාව දැනට රජයේ සේවයෙහි නියුතුව සිටින නිලධාරීන් කෙරෙහි බලපාන්නේ නැත.

(ආ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඒ හා සමාන විභාගයකින් සමත් වීම.

(ii) දැනට රේගු දෙපාර්තමේන්තුවේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් කණිෂ්ඨ විභාගයෙන් හෝ ඒ හා සමාන විභාගයකින් සමත් වීම.

(ඉ) බරපතල මුහුදු ඉංජිනේරු වැඩ කරන වැඩපලක වැද්දීම හා ලියන වඩු වැඩ (Fitting and Turning) යනාදියේ පස් වසක ආධුනිකත්වයක් තිබීම.

(ඊ) නොයෙක් වර්ගයන්ගේ බොයිලේරු හා සෑම බොයිලේරු මවුන්ටින්වල දැනීමක් ද මධ්‍යම හා කුඩා වාෂ්ප එන්ජින් මුළුමනින්ම අළුත්වැඩියා කිරීම, ස්ලයිඩ් වැල්ව් යෙදීම හා පිළියෙල කිරීමට හැකිවීමද.

(උ) (i) වාෂ්ප දොඹකර,

(ii) බොයිලේරු පොෂන පොම්ප,

(iii) වාෂ්පයෙන් ක්‍රියා කරන කේන්ද්‍රාපසාරක පොම්ප,

(iv) අධික වේගවත් ඩීසල් එන්ජින් නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම ගැන දැනීමක්, හා

(ඌ) බරපතල මුහුදු ඉංජිනේරු වැඩ කෙරෙන වැඩපලක ෆෝර්මන් හෝ සහකාර ෆෝර්මන් කෙනෙකු වශයෙන් පළපුරුද්දක් තිබීම. මොවුන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වේ.

5. ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතේ කොන්දේසි අනුව තේරුණු අයදුම්කරු විසින් පත්වීමේදී රුපියල් 2,000 ක ඇපයක් තැබිය යුතු ය.

6. ඔහු වැඩපල සම්පූර්ණයෙන් භාරව සිට සිරිත් පරිදි කෙරෙන නඩත්තු වැඩ සටහන් හා අළුත්වැඩියා කිරීම් පිළියෙල කිරීම හා ක්‍රියාවෙහි යෙදවීම ගැන ද වැඩපල හා ලෝන්ච් සම්බන්ධව ඇති වාර්තා තැබීම ගැනද වගකිය යුතු වන්නේ ය.

7. තේරුණු අයදුම්කරු දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුයි.

8. ආණ්ඩුවේ සේවාවෙහි නියුක්ත නිලධාරීන් එවන අයදුම්පත් නියමිත දිනයෙන් පසුව මෙහි ලැබුණොත්, එම අයදුම්පත් එම අයදුම්කරුවන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාට නියමිත දිනයට කලින් ලැබුණෙත් එය ප්‍රමාදවීමට සෑහෙන හේතු දක්වමින් ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා එය භාර ගන්නා ලෙස නිර්දේශ කළ හොත් මිස, භාරගනු නොලැබේ.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයේ මුල පළවී ඇති රජයේ පත්වීම් කෙරෙහි බලපාන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

10. අයදුම්පත් හා ඒ පිළිබඳ සෙසු ලියුම් කියුම් රේගු දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික නාමයට නොව ප්‍රධාන රේගු අයකැමි වෙත එවිය යුතුය.

ඒ. රත්නම්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

1960 අගෝස්තු මස 4 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේදීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ආධුනික පස් පරීක්ෂක තනතුරු

ආධුනික පස් පරීක්ෂක තනතුරු සඳහා අයදුම් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ. මෙහි පළ කොට ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව සකස් කළ අයදුම් පත්‍ර 1960 සැප්තැම්බර් මස 3 වැනි දින හෝ ඊට ප්‍රථම හෝ ලැබෙන ලෙස මා වෙත එවිය යුතුය. ඒ සඳහා ආකෘති පත්‍ර සපයනු නොලැබේ.

2. **වයස් සීමා.**—අයදුම්කරුවන්ගේ වයස 1960 සැප්තැම්බර් මස 3 වැනි දින වනවිට අවුරු 18 ට අඩු හෝ අවුරුදු 30 ට වැඩි හෝ නොවිය යුතුය.

3. **අධ්‍යාපන සුදුසුකම්.**—අයදුම්කරුවන් යටත් පිරිසෙයින් ගණිතය විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සාමර්ථ්‍යය ලබා සිටිය යුතුය. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයයන් ගෙන් සමාර්ථය ලැබූවන් හට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. **වැටුප.**—පස් පරීක්ෂක තනතුරට අදාල වැටුප නම්, වර්ෂයකට රු. 750—42—1,296 ය.

5. **සේවා කොන්දේසි.**—

(අ) තෝරා ගනු ලබන අපේක්ෂකයන් රසායනාගාරයේ හා ක්ෂෙත්‍ර කාර්යයන් පිළිබඳ සමසක අභ්‍යාස පාඨ මාර්ගයක් අනුගමනය කළ යුතුය. අභ්‍යාස පාඨ මාගීය සතුටුදායක ලෙස අවසන් කරන අපේක්ෂකයන් ඔවුන්ගේ වැඩ හා හැසිරීම සතුටුදායක වුවහොත් සමස අවසානයෙහි පස් පරීක්ෂක තනතුරු වලට පත් වීමට සුදුස්සන් වශයෙන් සළකනු ලැබේ. පුහුණුව ලබන කාලය තුළ ආධුනික පස් පරීක්ෂකවරුන්ට දිනකට රු. 2.30 ක් හා ජීවන දීමනා ද ගෙවනු ලැබේ. ආධුනික පස් පරීක්ෂක තනතුරුවලට පත් කිරීම තාවකාලිකය.

(ආ) ඉරු දිනයන්හි සහ පොදු නිවාඩු දිනයන්හිද පස් පරීක්ෂකයන් සේවය පිණිස පැමිණිය යුතු අතර ඔවුන් මුදලින් රු. 300 ක ඇප තැබිය යුතුය.

6. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම් පත්‍ර වලට පහත දැක්වෙන ලියවිලි වල පිටපත් (මුල් පිටපත් නොවේ.) අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා වෙනුවෙන් නිකුත් කරන ලද සහතික හෝ භාරගනු නොලැබේ).

(ආ) ලබා ගත් උසස් ම අධ්‍යාපන සුදුසුකම පිළිබඳ සහතිකය.

(ඉ) මෑතකදී නිකුත් කරන ලද චරිත සහතික 3 ක්. ඉන් එකක් අවසාන වරට උගත් පාඨශාලාවේ ප්‍රධානාචාර්ය වරයාගෙන් විය යුතුය.

(මේ සහතික පත්වල පිටපත් ආපසු නො එවන බව සැළකිය යුතුය.)

7. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයෙහි මූලාරම්භයේ පළකොට ඇති රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීමේ දී අදාල වන පොදු කොන්දේසි වලට මෙයින් අවධානය යොමු කරමි.

නි. විජේවර්ධන,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවටය.

1960 අගෝස්තු 3 දින,
කොළඹ, වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේදීය.

#### ආකෘති පත්‍රය

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ආධුනික පස් පරීක්ෂක තනතුර සඳහා ඉදිරිපත් කරන අයදුම් පත**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(2) ලිපිනය :————.

(3) (අ) උපන් දිනය සහ ස්ථානය :————.

(ආ) උපන් ස්ථානය—

(i) අයදුම්කරුගේ පියා :————.

(ii) අයදුම්කරුගේ සීයා (පිය පක්ෂයේ) :————.

(iii) අයදුම්කරුගේ මුත්තා (පිය පක්ෂයේ) :————.

අයදුම්කරුගේ උපත ලංකාවේ සිදුවුනිනම් (ආ) (i) හෝ (ii) සහ (iii) පිරවිය යුතුය. ඔහුගේ උපත ලංකාවේදී සිදු නොවිණි නම් (ආ) (i) සහ (ii) හෝ (iii) පිරවිය යුතුය.

(4) ජාතිය :————.

(5) අයදුම්කරු විවාහකද, අවිවාහකද නැතහොත් වැන්දඹුවෙක් ද යන බව :————.

(6) අධ්‍යාපන සුදුසුකම් (සාමාර්ථ්‍යය ලැබූ විෂයයන් සඳහන් කරන්න) :————.

(7) පස් පරීක්ෂණ හෝ ඉදිකිරීම් වැඩ සම්බන්ධව හෝ පළ පුරුද්දක් ඇතහොත් ඒ බව (සහතික වල පිටපත් අමුණන්න) :————.

(8) දැනට යම් තනතුරකට පත්වී සිටිනම් ඒ බව (එය තාවකාලිකද ස්ථිරද යන බව) :————.

(9) සහතික ඉදිරිපත් කර ඇත්තේ කවරකුගෙන් ද යන වග :————.

මා විසින් මේ අයදුම් පතෙහි සඳහන් කර ඇති තොරතුරු සැබෑ බවද නිවැරදි බවද මෙයින් සහතික කර සිටිමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැන ගන්නට ලැබුණොත් මා පත්වීම ලැබීමට නුසුදුස් සකු වන බවද, පත්වීමට පසු දැන ගන්නට ලැබුණොත් කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහ කරනු ලබන බවද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

ස්ථානය :————.

දිනය :————.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ආධුනික සැලසුම්කරු තනතුරු

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ආධුනික සැලසුම්කරු තනතුරු සඳහා අයදුම්පත්‍ර මෙයින් කැඳවනු ලැබේ. මෙහි පළ කොට ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව සකස් කළ අයදුම්පත්‍ර 1960 අගෝස්තු මස 26 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන ලෙස වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත එවිය යුතු ය.

2. **වැටුප සහ සේවයට බඳවා ගැනීමේ කොන්දේසි**—

(i) ආධුනික සැලසුම්කරු තනතුර තාවකාලිකය. ඊට අදළ වැටුප් ක්‍රමය නම්, වර්‍ෂයකට රුපියල් 960-72 බැගින් 2-1,104 ය. දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන දෙවැනි පන්තියේ සැලසුම්කරුවන් තෝරීමේ පරීක්ෂණයෙන් සාමාර්ථ්‍යය ලැබුව හොත් ඔවුහු රුපියල් 1,260 න් පටන් ගෙන 120 බැගින් 21 වරක් වැඩිවී 3,780 දක්වා නගින වාර්ෂික වැටුප් ක්‍රමයක් ඇති දෙවැනි පන්තියේ සැලසුම්කරුවන් වශයෙන් පත්වීමට සුදුස්සන් වශයෙන් සළකනු ලැබේ ;

(ii) ආධුනික සැලසුම්කරුවන්ගේ පාඨ මාගීය වර්‍ෂ තුනක් පැවැත් වේ. ඔවුහු පළමුවන වර්‍ෂය තුළ වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් පිළියෙල කරනු ලබන සැලසුම් ඇඳීමේ පාඨ මාගීය සම්පූර්ණ කළ යුතු ය. සාර්ථක ලෙස පාඨ මාගීය සම්පූර්ණ කළ ඉක්බිති වැඩිදුරටත් පුහුණු වීම සඳහා දෙපාර්තමේන්තුවේ සැලසුම් කාර්යාලයන් වෙත යවනු ලැබේ ;

(iii) තෝරා ගන්නා ලද අයදුම්කරුවන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දෙවැනි පන්තියේ සැලසුම්කරුවන් ලෙස සුදුසුකම් ලැබීම සඳහා තමන්ගේ ඉගෙනීමේ කටයුතු නොකඩවද ලැදිකමකින් ද හදාරන බවටත් පුහුණුව අවසන් වූ පසු නියම කරනු ලැබුවහොත් දෙපාර්තමේන්තුවේ දෙවැනි පන්තියේ සැලසුම්කරුවන් වශයෙන් වර්‍ෂ 5කට නොඅඩු කාලයක් සේවය කරන බවටත් ගිවිසුමකට බැඳිය යුතු ය. පුහුණුව ලබන අය හා ඔවුන්ගේ මවුපියන් හෝ නීත්‍යනුකූල භාරකරුවන් ද ඇප කරුවන් දෙදෙනෙකු සමග පුහුණු වීමේ කොන්දේසි නියම ලෙස පිළිපදින බවට රුපියල් 2,000 ක ඇපකරයකට අත්සන් තැබිය යුතු ය ;

(iv) තෝරා ගන්නා ලද අයදුම්කරුවන් අවසාන වශයෙන් පත් කර ගැනීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමර්ථ විය යුතු ය.

**3. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්‍ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය :—

(අ) 1960.8.26 වැනි දින වන විට වයස අවුරුදු 18 වත් 25 වත් අතර බව ;

(ආ) ගණිතය විෂයයක් වශයෙන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ සාමාන්‍ය පෙළ අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් සිංහල භාෂාවෙන් (“ අ ” හෝ “ ආ ” නිර්දේශ පත්‍රිකාව) හෝ දෙමළ භාෂාවෙන් (“ අ ” හෝ “ ආ ” නිර්දේශ පත්‍රිකාව) හෝ අංක ගණිතය, වාණිජ අංක ගණිතය, මූලික ගණිතය, ශුද්ධ ගණිතය යන විෂයයන්ගෙන් එකකින් හා විකල්ප විෂයයන් 4 කින් ද එක විට සාමාර්ථ්‍යය ලබා ඇති බව ;

ඉහත කී විභාගයෙන් සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් සාමාර්ථ්‍යය ලබා ඇති අය ඉංග්‍රීසි භාෂා විෂයයෙන් සාමාර්ථ්‍යය ලබා සිටිය යුතු ය.

(ඉ) විශිෂ්ට චරිතයකින් යුක්ත බව.

4. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්වල පහත දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් ලියවිලි නොවේ) අමුණා එවිය යුතු ය :—

(අ) ලබාගත් උසස් ම අධ්‍යාපන සුදුසුකම පිළිබඳ සහතිකය.

(ආ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා වෙනුවෙන් නිකුත් කරන සහතික හෝ බාර ගනු නො ලැබේ.)

(ඉ) තම සුදුසුකම් සහ චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතික පත්‍ර තුනක්.

සැ. යු.—මේ සහතික පත්වල පිටපත් ආපසු එවන්නේ නැත.

5. කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්‍ෂණයකට තම වියදමෙන්ම පැමිණෙන ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබේ.

6. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයෙහි මුලාරම්භයේ පළ කර ඇති රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීමේදී අදාළ වන පොදු කොන්දේසිවලට මෙයින් අවධානය යොමු කරමි.

නි. විජේවර්ධන,
වාරිමාර්ග අධ්‍යක්‍ෂ වෙනුවට ය.

1960 අගෝස්තු මස 4 වැනි දින,
තැ. පෙ. 500,
කොළඹ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේදී. ය.

## ආකෘති පත්‍රය

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ආධුනික සැලසුම්කරු තනතුර සඳහා ඉදිරිපත් කරන අයදුම් පත**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) පෙළපත් නම :————.
   (ආ) වෙනත් නම් :————.

2. ස්ත්‍රී, පුරුෂ භාවය :————.

3. ලිපිනය :————.

4. ජාතිය :————.

5. (අ) අයදුම්කරුගේ උපන් දිනය සහ ස්ථානය :————.
   (ආ) උපන් ස්ථානය : (i) අයදුම්කරුගේ පියා :————.
   (ii) අයදුම්කරුගේ සීයා (පිය පක්‍ෂයේ) :
   (iii) අයදුම්කරුගේ මුත්තා (පිය පක්‍ෂයේ) :————.

   අයදුම්කරුගේ උපත ලංකාවේ සිදුවුනි නම්, (ආ) (i) හෝ (ii) සහ (iii) පිරවිය යුතු ය. ඔහුගේ උපත ලංකාවේදී සිදු නොවිණි නම්, (ආ) (i) සහ (ii) හෝ (iii) පිරවිය යුතු ය.

6. සාමාර්ථ්‍යය ලැබූ විෂයයන් අඩංගු කොට අධ්‍යාපන සුදුසුකම් : සම්මාන ලත් විෂයයන් සඳහන් කරන්න :————.

7. විවාහක ද, අවිවාහක ද යන්න :————.

8. පාඨශාලාවෙන් අස්වූ පසු කරන ලද රක්‍ෂා :————.

9. දැනට රක්‍ෂාවක යෙදී සිටි නම්, ඒ පිළිබඳ විස්තර :————.

10. චරිත සහතික ඉදිරිපත් කරන්නේ කාගෙන් ද යන බව : ————.

මෙම ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති කරුණු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

ස්ථානය :————.

දිනය :————.

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

**ඉඩම් සංවර්ධන ආඥපණත යටතේ ඉඩම් කච්චේරි පරිපාලක තනතුරු**

ඉඩම් සංවර්ධන ආඥපණත යටතේ ඉඩම් කච්චේරි පරිපාලක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. **වැටුප් හා දීමනාවන් හා සේවය පිළිබඳ කොන්දේසි.**—මේ තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රු. 1,380 න් පටන් ගෙන වර්ෂයට රු. 120 බැගින් වැඩිවී රු. 3,780 තෙක් නගී. රජයේ රෙගුලාසි අනුව ජීවන වියදම් සහ ගෙවල් කුලී ගෙවනු ඇත.

3. **අයදුම්කරුවන්ට තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්.**—අයදුම්කරුවෝ වයස අවුරුදු 20 වත් 35 වත් අතර ලාංකිකයන් විය යුතුය. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවනට වයස සීමාවක් නැත.

අයදුම්කරුවෝ—

(අ) ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය හෝ ඊට සමාන විභාගයකින් සාමාර්ථය සහ,

(ආ) (1) පේරාදෙණියේ කෘෂිකර්ම විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර ලද්දවුන් හෝ (2) 1943 අංක 2 දරණ ආහාර නිෂ්පාදන (වතු) ආඥපණත යටතේ පරීක්‍ෂයෙකු වශයෙන් හෝ ආහාර නිෂ්පාදන නිලධාරියෙකු වශයෙන් හෝ අලුතෙන් රබර් වැවීමේ ව්‍යාපාරය යටතේ දිස්ත්‍රික්කයක් හෝ තලාවක් හෝ භාර නිලධාරියෙකු වශයෙන් හෝ කෘෂිකර්ම කටයුතු පිළිබඳ අවුරුදු 3 කට නොඅඩු කාලයක පළපුරුද්දක් ඇති අය හෝ (3) මෙම දෙපාර්තමේන්තුවේ රු. 1,056—72—2,424 වැටුප් ක්‍රමය යටතේ ඉඩම් කච්චේරි පරිපාලක තනතුරක අවුරුදු 4 කට නොඅඩු සතුටුදායක සේවයක් ඇති අය (කනිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලත් (ආ) (3) කොටසෙහි සඳහන් පරිපාලකවරුන්ගේ අධ්‍යාපන සුදුසුකම් අත්හැර දමනවා ඇත.) හෝ (4) අක්කර 100 කට නොඅඩු වත්තක තේ හෝ රබර් හෝ පොල් වැවීම සම්බන්ධයෙන් අවුරුදු 3 ක පළපුරුද්දක් ඇති අය හෝ, (5) මෙම දෙපාර්තමේන්තුවේ පළමුවැනි ශ්‍රේණියේ ඉඩම් සංවර්ධන ආඥ පණත යටතේ ඉඩම් කච්චේරි ඕවර්සියර් කෙනෙකු වශයෙන් අවුරුදු 7 කට නො අඩු සේවයක් ඇති රු. 1,380 කට නො අඩු වාර්ෂික වේතනයක් ලබන සතුටුදායක සේවයක් ඇති අය විය යුතුය.

4. **සේවය පිළිබඳ කොන්දේසි.**—මෙම පත්වීම අවුරුදු 3 ක පරීක්‍ෂණාත්මක කාලයකට යටත් ය.

(අ) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් තනතුරුවලට පත් කිරීමට ප්‍රථම වෛද්‍ය පරීක්‍ෂණයකින් සමත් විය යුතුය.

(ආ) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් විසින් මෝටර් බයිසිකලයක් වැනි අනුමත කරන ලද වාහනයක් සපයා ගත යුතුය. රජයේ මුදල් රෙගුලාසි අනුව ඔවුන්ට ගමන් ගාස්තු ගෙවනු ලැබේ.

(ඇ) තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් රු. 500 ක ඇපයක් තැබීමට සූදානම් විය යුතුය.

(ඈ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස දැනට පනවා ඇති නීති හා මින් මතු පනවන නීති වලටද, විශේෂයෙන් 1956 අංක 33 දරණ රජයේ භාෂා පණතේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ නීතිවලට ද තෝරාගනු ලැබූ අපේක්ෂකයින් බැඳී සිටිය යුතුය.

5. තම චරිතය පිළිබඳව මෑතදී ලබාගත් සහතික පත්‍ර දෙකක පිටපත් අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතුය.

6. නියමිත පෝරමය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1960 අගෝස්තු මස 26 වැනි දිනට හෝ ඊට පෙර, “ ඉඩම් කොමසාරිස්, තැ. පෙ. 500, කොළඹ ” කියා මෙම කාර්යාලයට එවිය යුතුය. නියමිත පෝරමයට වෙනස් අයදුම් පත්‍ර භාරගනු නොලැබේ.

7. **අයදුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.**

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ මුල පළ වූ, රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත් කිරීම් වලට අදාළ වූ පොදු කොන්දේසි බලන ලෙස ඉල්ලමි.

ඒ. සෙන්ට්. වි. විජේමාන්න,
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අගොස්තු මස 2 වැනි දින,
කොළඹ දීය.

### ආකෘති පත්‍රය

**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව—ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ ඉඩම් කච්චි පරිපාලක තනතුරු**

1. සම්පූර්ණ නම, ජාතිය සහ ලිපිනය :————.

2.* උපන් දින හා උපන් ස්ථානය :————.

(අ) අයදුම්කරුගේ (උප්පැන්න සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුයි).

(ආ) අපේක්ෂකයාගේ පියාගේ :————.

(ඇ) අපේක්ෂකයාගේ පිය පාර්ශවයේ මුත්තාගේ :————.

(ඈ) අපේක්ෂකයාගේ පිය පාර්ශවයේ මී මුත්තාගේ :————.

3. අධ්‍යාපනික සුදුසුකම් (සමර්ථ වූ දින සහිතව පිටපතක් ඇමිණිය යුතුය).

4. පාඨශාලාවෙන් අස් වූ දින සිට කරන ලද රක්ෂාවල් පිළිබඳ සම්පූර්ණ විස්තර සහිතව දැනට ලැබෙන වේතනය හා වැටුප් ක්‍රමය :————.

5. කෘෂිකර්ම කටයුතු පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්ද (සහතිකවල පිට පත් ඇමිණිය යුතුය. වත්තේ බිම් ප්‍රමාණය සඳහන් කරන්න.) ————.

6. යුද්ධ සේවයේ යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර :————.

7. අමුණා ඇති සහතික වල ගණන :————.

8. අයදුම්කරුගේ චරිතය පිළිබඳ දැනීමත් ඇත්තවුන් දෙදෙනෙකු ගේ නම් සහ ලිපිනයත් ඔවුන්ගේ තනතුරුත් :————.

————

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

* අයදුම්කරු ලංකාවෙහි ඉපදුනි නම් (අ) සමග (ආ) හෝ (ඇ) හා (ඈ) දෙකම හෝ පිරවිය යුතුය. අයදුම්කරු ලංකාවෙහි නො ඉපදුනි නම් (අ) සමග (ආ) හෝ (ඇ) දෙක හෝ (ඈ) දෙකම පිරවිය යුතුය.

---

## කොළඹ වරාය කොමිෂන් සභාවේ 2 වන ශ්‍රේණියේ රසායනාගාර සහකාර තනතුර

කොළඹ වරාය කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ 2 වන ශ්‍රේණියේ රසායනාගාර සහකාර තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1960 අගෝස්තු මස 31 වෙනි දින හෝ එයට පෙර මා වෙත ලැබිය යුතුය.

2. **වැටුප්.**—වර්ෂයට රු. 1,020—120 රු. 2,820 කි.

3. **සේවයට බාරගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් රහිතය, (ii) තෝරාගනු ලබන අයදුම්කරු අවුරුදු තුනක කාලයක් පරීක්ෂණ යටතේ තබනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—පහත දැක්වේන සුදුසුකම් වලින් තමන් සම්පූර්ණ බවට සෑම ඉල්ලුම් කරුවෙකු විසින්ම කරුණු ඔප්පු කළ යුතුය :—

(i) 1960 අගෝස්තු මස 31 වෙනි දිනට වයස අවුරුදු 18 කට නො අඩු අවුරුදු 30 කට නොවැඩි විය යුතුය.

(ii) (අ) රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයන්ගෙන් සම්මාන සාමාර්ථ ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වී සිටිය යුතුය.

(ආ) ඉතා සියුම්වූ විදුලි කොට්ඨාස පරීක්ෂා කරන උපකරණ පාවිච්චිය පිළිබඳ පළපුරුද්ද හා ද්‍රව්‍ය පරීක්ෂණය මැනවින් දත යුතුය.

භෞතික විද්‍යාව හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උද්ග්‍රහණ පරිපාටිය සම්බන්ධව අතිරේක සැලකිල්ලක් ඇති අය ගැන විශේෂයෙන් සලකනු ලැබේ.

(iii) ඉතාමත් හොඳ සදාචාර චරිතයකින් යුක්ත විය යුතු අතර ශරීර සෞඛ්‍යය ද හොඳ විය යුතුය.

5. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකපත් වල පිටපත් (මුල් පිටපත් නොවේ) තම ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) අධ්‍යාපන සහ/හෝ වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතික.

(ඉ) ඉගෙනීම, චරිතය, හා මෙම තනතුරට පත්කර ගැනීම පිළිබඳ යෝග්‍යතාවයන් දැක්වෙන ළඟදීම ලබාගත් සහතික තුනක්.—

6. මෙම තනතුර සඳහා වූ ඉල්ලුම් පත්‍රය හෝ වෙනත් ලියුම් වරාය කොමසාරිස් තැන වෙත එවිය යුතු අතර මේ පිළිබඳ කිසිම ලියවිල්ලක් මෙම දෙපාර්තමේන්තුවේ කවර නිලධාරියෙකු ගේ හෝ පෞද්ගලික ලිපිනයට නොඑවිය යුතුය.

7. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ II වන ඡේදයේ දැක්වෙන රාජ්‍යසේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි සැලකිල්ල යොමු කරනු ලැබේ.

ඒ. ඇස්. කොහොබන් වික්‍රම,
වරාය කොමසාරිස්.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1, 1960 ජූලි මස 29 දින.

**කොළඹ වරාය කොමිෂන් සභාවේ 2 වන ශ්‍රේණියේ රසායනාගාර සහකාර තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

(1) සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) ජාතිය :————.

(4) 60.8.31 වෙනි දිනට නියම වයස :————. අවු :————. මාස ————. දින :————.

(5) අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :————.

(6) (අ) විදුලි කොට්ඨාශ පරීක්ෂා කරන උපකරණ පිළිබඳ පළපුරුද්ද :————.

(ආ) උද්ග්‍රහණ පරිපාටි අතිරේක සැලකිල්ලක් ඇත්තේ කවර විෂයයන් සඳහාද යන්න පිළිබඳ විස්තර :————.

(7) සහතික ලබාගත් අයගේ නම් සහ තනතුරු :————.

(8) වෙනත් අයිතිවාසිකම් පිළිබඳ විස්තර :————.

————,

ඉල්ලුම්කරු ගේ අත්සන.

දිනය :————.

---

## ධීවර දෙපාර්තමේන්තුව

**තාවකාලික සමුද්‍ර ඉංජිනේරු සහායක තනතුර**

කොළඹ ධීවර දෙපාර්තමේන්තුවේ තාවකාලික සමුද්‍ර ඉංජිනේරු සහායක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ. පහත පෙනෙන ආකෘති පත්‍රය පරිදි සකස් කරණ ලද ඉල්ලුම් පත්‍ර, 1960 සැප්තැම්බර් 2 වැනිදාට හෝ ඊට ප්‍රථම මට ලැබෙන්නට සැලැස්විය යුතුයි.

**2. වේතනය, අමතර දීමනා සහ සේවා කොන්දේසි**

මේ තනතුර තාවකාලිකය. මෙයට හිමි වැටුප් ක්‍රමය මෙසේය. වර්ෂයකට රුපියල් 2,580 (පුහුණුව ලබන අවුරුදු දෙක තුලදී) ; පුහුණුව සාර්ථක ලෙස නිම කිරීමෙන් පසු වර්ෂයකට රුපියල් 3,300—120 සහ 180—රු. 5,340.

**සැලකිය යුතුයි.**—ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියකු සේවය පිණිස අනුදන්නා ලැබුවහොත් ඔහුගේ අනුදන්නා ලැබූ තනතුරේ වැටුප (පඩි වැඩිවීම් සහිතව) ඒ නිලධාරියා ගේ ස්ථිර තනතුරේ වැටුපේ සියයට 150 සීමාවට යටත් වෙයි.

**3. අවශ්‍ය සුදුසුකම්**

සෑම අයදුම් කරුවකු විසින්ම පහත දක්වන සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1960.8.12 වැනිදාට වයස අවුරුදු 25ට නො අඩු බවට හා අවුරුදු 40ට වැඩි නොවන බවට.

(ආ) (i) කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතික පත්‍රය සහ පිළිගත් ඉංජිනේරු වැඩපලක පෝමන් වශයෙන් අවුරුදු 8ක පළපුරුද්දක් හෝ

(ii) ලංකා කාර්මික විද්‍යාලය විසින් නිකුත් කළ, මැකනික් ඉංජිනේරු ශිල්පී දිවාකාල ඩිප්ලෝමා සහතිකය සහ පිළිගත් ඉන්ජිනේරු වැඩපලක අවුරුදු 2ක පළපුරුද්ද, හෝ

(iii) පිළිගත් වැඩපොළවල ආධුනික කාලය ඇතුළුව අවුරුදු 15ක පළපුරුද්ද සහ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට උසස් හෝ සමාන සහතිකය. මේ කාලයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 8ක් පරිපාලන පෝමන් වශයෙන් සේවය කර තිබිය යුතුයි.

(iv) විශිෂ්ඨ චරිත ශුද්ධියක් හා හොඳ ශරීර සනීපයක් ඇත්තකු බවට.

4. ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුතුයි :—

(i) උප්පැන්න සහතිකය (බව්තීස්ම සහතික හෝ උපකෘත පාසල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයන් සඳහා නිකුත් කරණ ලද සහතික පත් බාර ගනු නොලැබේ.)

(ii) අද්ධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(iii) ළඟදී ලබාගත් චරිත සහතික තුනක්.

5. ඉල්ලුම් පත්‍ර හෝ ඒවාට සම්බන්ධ ඕනෑම ලියවිල්ලක් එවිය යුත්තේ, ධීවර අධ්‍යක්‍ෂ යන පදවි ලිපිනයට විනා, දෙපාර්තමේන්තුවේ වෙන කිසිම නිලධාරියකුගේ පුද්ගලික නමට නොවේ.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡෙදයේ මුල පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම් පිළිබඳ පොදු කොන්දේසි කියවා බලන්න.

ඞී. ටී. ඊ. ඒ. ද පොන්සේකා.
ධීවර අධ්‍යක්‍ෂ.

1960 ජුලි 30 වැනිද,
කොළඹ 3,
තැපැල් පෙට්ටිය 531,
ධීවර දෙපාර්තමේන්තුවේදීය.

## අයදුම් පත් ආකෘති පත්‍රය

### තාවකාලික සමුද්‍ර ඉංජිනේරු සහායක තනතුර

1. සම්පූර්ණ නම—
   පෙළපත් නාමය :————.
   අනික් නම් :————.

2. ලිපිනය :————.

3. ජාතිය :————.

4. ——— වැනිදට වයස :————.

5. උපන් දිනය :————. (උප්පැන්න සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

6. උපන් ස්ථානය—
   (අ) ඉල්ලුම් කරු :————.
   (ආ) ඉල්ලුම් කරුගේ පියා :————.
   (ඇ) ඉල්ලුම් කරුගේ පියාගේ පියා :————.
   (ඈ) ඉල්ලුම් කරුගේ පියාගේ පියාගේත් පියා :————.

7. විවාහකද අවිවාහකද යන වග :————.

8. අද්ධ්‍යාපනික සුදුසුකම්. සමත්වූ ප්‍රසිද්ධ විභාගයන්ගේ දිනයන් සහ අන්තිමට සමත්වූ ප්‍රසිද්ධ විභාගයේදී ගත් විෂයයන් සඳහන් කරන්න. (ඉහළම විභාගයේ සහතික පත්‍රයේ පිට පතක් ඇමිණිය යුතුයි.) :————.

9. දැන්වීමේ 3 (ආ) ඡේදයේ සඳහන් සුදුසුකම්වලින් ඔබට ඇත්තේ කුමණ සුදුසු කමක්ද? ඒ සුදුසුකම සනාථ කිරීමට සහතික ඇමිණිය යුතුයි :————.

10. කාර්මික සහ වෘත්තීය සුදුසුකම්, විභාගයේ දින හෝ පුහුණුව සම්පූර්ණ කළ දින :————.

11. අධ්‍යාපනය අවසාන කළායින් පසු, කළ රක්‍ෂා පිළිබඳ දින සහිත විස්තර :————.

12. දැනට කරන රක්‍ෂාව සහ වැටුප :————.

13. ඉල්ලුම්කරු පුද්ගලික වශයෙන් දන්නා නෑනෑත්තන් දෙදෙනකුගේ නම්, පදවි සහ ලිපිනයන්, මේ අයගෙන් චරිත සහතික නො ලබා තිබිය යුතුයි :————.

14. චරිත සහතික ලබාගත් අයගේ නම් හා ලිපිනයන් : (එසේ ලබා ගත් චරිත සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :————.

15. යුද්ධ හමුදාවේ සේවය කර තිබේ නම්, සේවය කළ කාලය : ————.

16. තනතුර සඳහා ඇති විශේෂ හිමිකම් :————.

————,
අත්සන.

දිනය :————.

කොළඹ, තැපැල් පෙට්ටිය 531,
ධීවර අධ්‍යක්‍ෂ වෙතය.

## ධීවර දෙපාර්තමේන්තුව

### ධීවර සහායක තනතුර

ධීවර දෙපාර්තමේන්තුවේ ධීවර සහායක තනතුර සඳහා පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරණ ලද අයදුම් පත් 1960 සැප්තැම්බර් 2 දින හෝ ඊට පෙර භාරගනු ලැබේ.

2. වැටුප.—වර්ෂයකට රුපියල් 3,360න් පටන්ගෙන රුපියල් 360ක වාර්ෂික වැඩිවීමක් ඇතිව රුපියල් 8,400න් අවසන් වන වැටුප් ක්‍රමයක් මේ තනතුරට හිමිය.

3. සේවා කොන්දේසි—තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම පිළිබඳ ආධුනික කාලය තුන් වර්ෂයක් වේ. ස්ථිර නිලධාරියකු තෝරා ගතහොත්, පටන් ගැන්මේදී, නියමිත කාල පරිච්ඡේදයකට වැඩ බැලීමට පත් කරණු ලැබේ.

4. නිලධාරියා පත් කිරීමේ දිනයේ සිට අවුරුදු හතරක් ඇතුලතදී, පොදු සේවා කොමිසමේ නීතිරීති, මූල්‍ය ව්‍යවස්ථා, කායාී සංවිධාන ව්‍යවස්ථා, ධීවර ආඥාපනත සහ රෙගුලාසි පිළිබඳව පරීක්‍ෂණයකින් සමර්ථ විය යුතුයි. අවුරුදු හතර තුලදී එම නිලධාරියාට මේ පරීක්‍ෂණයෙන් සමර්ථවන්නට නොහැකි වුවහොත්, ඔහුගේ වාර්ෂික වැටුප් වැඩිවීම හිග හිටවනු ලැබේ. ඊට පසුව පරීක්‍ෂණයෙන්, සමත්වන තුරු වැටුප් වැඩිවීම ප්‍රමාද කරණු ලැබේ.

5. වුවමනා සුදුසුකම්—සෑම අයදුම්කරුවකු විසින්ම පහත දක්වන සුදුසුකම් ඇතිබවට සෑහෙන සාක්‍ෂි ඉදිරිපත් කළ යුතුයි.

(අ) 1960 සැප්තැම්බර් 2 වැනිදාට වයස අවුරුදු 22ට නොඅඩු බවට හා අවුරුදු 35ට වැඩි නොවන බවට.
(රාජ්‍ය සේවයේ දැනට සිටින නිලධාරීන්ට මේ වයස් සීමා අදාල නොවේ.)

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු බවට. (පාලන කටයුතු පිළිබඳ පළපුරුදු ඇති අයට විශේෂ සැළකිලි දක්වනු ලැබේ).

**සංලක්‍ෂ්‍යය :** ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමර්ථ වූ, දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් ලැබෙන ඉල්ලුම් පත්‍ර ගැනද, එවැනි ඉල්ලුම් කරුවන් රජය යටතේ අවුරුදු 10ක සතුටුදායක සේවයක් කර තිබේ නම්, සලකා බලනු ලැබේ.

(ඇ) විශිෂ්ඨ චරිත ශුද්ධියක් හා හොඳ ශරීර සනීපයක් ඇත්තකු බවට.

6. අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය (බව්තීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාසැල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයන් සඳහා නිකුත් කරණ ලද සහතික පත් බාරගනු නොලැබේ.)

(ආ) උපාධිය හෝ අධ්‍යාපනික උසස්ම සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්. එයින් එකක් ඉගෙනීම පිළිබඳ අධ්‍යක්‍ෂ, විද්‍යාලයේ ආචාර්ය හෝ මහාචායාීවරයාගෙන් ලබාගත්තක් විය යුතුයි.

(ඈ) වෘත්තීය සහතික පත්‍ර සහ/හෝ ශිල්පීය සුදුසුකම්.

(ඉ) සිංහල සහ/හෝ දෙමළ භාෂාවෙන් සමර්ථ වී ඇති උසස්ම විභාගයේ සහතික පත්‍රය.

7. ඉල්ලුම් පත්‍ර හෝ ඒවාට සම්බන්ධ වෙන ඕනෑම ලියවිල්ලක් එවිය යුත්තේ, ධීවර අධ්‍යක්‍ෂ යන පදවි ලිපිනයට විනා, දෙපාර්තමේන්තුවේ වෙන කිසිම නිලධාරියකුගේ පුද්ගලික නමට නොවේ.

8. 1959 ජූනි 26 වෙනිදා අංක 11,789 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1959 ජූනි 18 වැනි දාතම දරන දැන්වීම ප්‍රකාර මේ තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර එවූ අපේක්‍ෂකයන්, මේ දැන්වීම අනුව සුදුසු කම් ලබා තිබේ නම්, නැවත් ඉල්ලුම් පත්‍ර එවිය යුතුයි.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II ඡේදයේ මුල පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම පිළිබඳ පොදු කොන්දේසි කියවා බලන්න.

ඞී. ටී. ඊ. ඒ. ද පොන්සේකා,
ධීවර අධ්‍යක්‍ෂ.

1960 අගෝස්තු 3 වැනිදා,
කොළඹ, ගාලුමුවදොර,
තැපැල් පෙට්ටිය, 531,
ධීවර දෙපාර්තමේන්තුවේදීය.

## අයදුම් පත් ආකෘති පත්‍රය

### ධීවර දෙපාර්තමේන්තුව—ධීවර සහායක තනතුර

1. සම්පූර්ණ නම :————.
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) අනික් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) 1959 සැප්තැම්බර 2 වැනිදාට නිවැරදි වයස :————.
අවුරුදු————මාස————දින————.
(ආ) උපන් දිනය (උප්පැන්න සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

4. (අ) අයදුම්කරුගේ උපන් ස්ථානය :————.
(ආ) අයදුම් කරුගේ පියාගේ උපන් ස්ථානය :————.
(ඇ) පියාගේ පියා උපන් ස්ථානය :————.
(ඈ) පියාගේ ආත්තාගේ උපන් ස්ථානය :————.

5. ලාංකිකද, ලාංකික බව ලබාගත් පිළිවෙල :————.

6. අයදුම්කරු විවාහකද, අවිවාහකද, භායභාව මළ පුරුෂයෙක්ද? : ————.

7. අධ්‍යාපනික ජීවිතය, පාඨශාලා හෝ විද්‍යාලයයන්ට ඇතුල් වූ සහ අස්වූ දිනයත්, සමත් වූ ප්‍රසිද්ධ විභාගයත්, අන්තිමට සමර්ථ වූ ප්‍රසිද්ධ විභාගයන් හිදී ගත් විෂයයක් :————.

8. අධ්‍යාපනය අවසන් කළ පසු කරණ ලද රක්ෂාවල් (දින සහ විස්තර දෙන්න) :————.

9. ශිල්පීය සහ වෘත්තීය සුදුසුකම්, දින, විභාග හෝ පුහුණුව පිළිබඳ විස්තර දෙන්න :————.

10. ක්‍රීඩා පිළිබඳ තොරතුරු :————.

11. ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ කියවීම, ලිවීම හා පරිකථනය පිළිබඳ දක්ෂතාවය :————.

12. දැනට කරණ රක්ෂාව හා වේතනය :————.

13. අයදුම්කරු පුද්ගලික වශයෙන් දන්නා නෑනැත්තන් දෙදෙනකුගේ නම් හා පදවි (මොවුන්ගෙන් චරිත සහතිකපත්‍ර ලබා නොගෙන තිබිය යුතුයි.) :————.

14. විශේෂ හිමිකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර එනම්, මේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරණ තනතුරේ කටයුතු හා සමාන සේවයන් පිළිබඳ පලපුරුද්ද :————.

15. යුද්ධ සේවය කර ඇතොත් එය :————.

16. වෙනත් තොරතුරු :————.

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් දී ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙසින් සහතික කරමි. මෙහි යම්කිසි තොරතුරක් අසත්‍යයැයි හෝ වැරදි යැයි මා පත්කිරීමට පළමු සොයාගතහොත් මා තනතුරට නුසුදුස්සකු වන බවත්, පත්කිරීමෙන් පසු, එය සොයා ගතහොත් මා රාජකාරියෙන් පහකිරීමට එය හේතුවක් වෙන බවත් දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

කොළඹ,
තැ. පෙ. 531,
ධීවර අධිකාරි වෙතය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ.පෙ. 500, කොළඹ 1), කපු රෙදි පාන්කඩ සැපයීම සඳහා 1960 සැප්තැම්බර් 6 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාතීමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට 1960 සැප්තැම්බර් 5 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාතීමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1960 අගෝස්තු 12 වැනි දින,
කොළඹදීය.

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), මෙරට සෑදූ බැනියන් සැපයීම සඳහා 1960 සැප්තැම්බර් 6 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේ දී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තනේතුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් අණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට 1960 සැප්තැම්බර් 5 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1960 අගෝස්තු 12 වැනි දින,
කොළඹදීය.

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : 500 වැනි තැපැල් පෙට්ටිය, කොළඹ 1), මැනිලා කඹ සැපයීම සඳහා 1960 නොවැම්බර් 15 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාතීමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100 ක ටෙන්ඩර තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 නොවැම්බර් 14 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර ෆෝරම කොළ දෙනු ලැබේ.

විදේශීය ටෙන්ඩරකරුවන් සඳහා විශෙෂ ටෙන්ඩර ෆෝරම සකස් කර තිබේ. රු: 100 ක ටෙන්ඩර තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී ෆෝරම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර ෆෝරම කොල ද යි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1960 අගෝස්තු 12 වැනිදා,
කොළඹ දී ය.

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### අයි. සී. ඒ. ටෙන්ඩර් දැන්වීමයි

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ඔක්තෝබර් 11 වැනි දින පෙරවරු 10 දක්වා මැලේරියා මර්ධන ව්‍යාපාරයට පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

| ද්‍රව්‍ය | ටෙන්ඩර් අංකය |
|---|---|
| 1. ඩූල් ග්‍රයින්ඩරයක් ආදී කරුණු 12ක් | අයි. සී. ඒ. 272 |
| 2. චේන් හොයිස්ට් යන්ත්‍රයක් ආදී කරුණු 6ක් | අයි. සී. ඒ. 275 |

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට පෙර ටෙන්ඩර් කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන්ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩුගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1960 අගෝස්තු 8 වැනි දින,
කොළඹ 2.

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), ජර්සිස් සැපයීම සඳහා 1960 සැප්තැම්බර් 6 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 සැප්තැම්බර් 5 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1960 අගෝස්තු 12 වැනි දින,
කොළඹ දීය.

---

## ලුණු දෙපාර්තමේන්තුව

1960 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1961 සැප්තැම්බර් මස 30 වැනි දින වනතුරු මඩකලපුවේ දුම්රිය ස්ථානයේ සිට මඩකලපුවේ ලුණු ගබඩාවට ගෝනිවල අසුරන ලද ලුණු පටවාගෙන යැම සඳහා ටැන්ඩර් පත්‍ර කොළඹ කොම්පඤ්ඤවීදියේ ජේනරල්ස් ලේක් පාරේ නොම්මර 110, තැපැල් පෙට්ටිය නො. 539 දරණ ලුණු කොමසාරිස් තැන විසින් 1960ක් වූ සැප්තැම්බර් මස 2 වැනි සිකුරාදා පස්වරු 3 වනතුරු භාරගනු ලැබේ.

2. ටැන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනු පිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ මඩකලපුවේ ආණ්ඩුවේ දිසාපති තැනගෙන් ලබාගන්නා ෆෝර්ම කොළවලය. ටැන්ඩර් තැන් පත් මුදලක් වශයෙන් රු. 25ක් ඕනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටැන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ. වැඩි විස්තර ඉහත සඳහන් අයවලුන්ගෙන් ලබාගත හැක.

ඊ. බී. තිසවීරසිංහ,
ලුණු කොමසාරිස්.

අංකය : ටීජී 91.

1960 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ.

---

## මීගමුවේ තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයට 1960-61 ආදායම් වර්ෂය සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවීම

1960 සැප්තැම්බර් මස 2 වැනි දින පෙරවරු 9.30 දක්වා මෙහි පහත සඳහන් ද්‍රව්‍ය මීගමුවේ තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල යට 1960-61 ආදායම් වර්ෂය තුළ සැපයීම පිණිස ටෙන්ඩර් පත්‍ර මෙහි පහත අත්සන් කරන අය විසින් භාරගනු ලැබේ.

**ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් කළයුතු මුදල**

| | | රු. | ශ. |
|---|---|---|---|
| (අ) | මුස්න තැනීමට යෝග්‍ය මිටි | 25 | 00 |
| (ආ) | මෙරට වේවැල් | 25 | 00 |
| (ඉ) | නො. 1 පීරාපු පොල් කොහු | 25 | 00 |
| (ඊ) | වියලි පොල් ඉරට | 25 | 00 |

**සැලකිය යුතුයි :**—පීරපු පොල් කොහු සහ වියලි පොල් ඉරට සැප සීම පිණිස ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන්නේ 6 මසකට සීමාවූ කාලය කට පමණය. එනම් වර්ෂ 1960 ඔක්තෝම්බර් මස 1 වෙනි දින සිට 1961 මාර්තු මස 31 වැනි දින දක්වාය.

එක් එක් ද්‍රව්‍ය සම්බන්ධයෙන් නියමිත මුදල් කොළඹ බන්ධනා ගාර මූලස්ථානයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් මුද්‍රණය කරන ලද ටෙන්ඩර් ආකෘතිය (ෆෝර්ම) පහත අත්සන් කරන අයගේ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ටෙන්ඩර්කරුවන් විසින් විශෙෂයෙන් සැලකිය යුත්තක් නම් තමා නියම කරන ලද මිල ගණන් ටෙන්ඩර් පත්‍රයේ අකුරින් හා ඉලක්ක මින් දැක්වීමයි. එසේ අකුරින් හා ඉලක්කමින් සඳහන් නොවූ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ.

1960 සැප්තැම්බර් මස 2 වැනි දින පෙරවරු 9.30ට පහත අත්සන් කරන අයගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එකී වේලාවේදී කැමති ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවීමට නොසතුටු ටෙන්ඩර් කරුවන් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් මගින් පිටත මුද්‍රා සහිත නම, ලිපිනය සහ සේවයද සඳහන් කොට ටෙන්ඩර් පත්‍ර පෞද්ගලිකවම ඒ සඳහා බලයලත් නිලධාරියෙකුට භාරදී කුවිතාන්සියක් ලබාගත යුතුය.

වැඩි විස්තර පහත සඳහන් අයගෙන් ලබාගත යුතුයි.

ඊ. ඒ. ඇස්. ඩබ්ලිව්. පෙරේරා,
තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස
විද්‍යාලයේ අධිකාරි.

1960 අගෝස්තු මස 5 වැනි දින,
මීගමුව.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ කොටා රෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරි මාර්ග ඉංජිනේරු තැන විසින් 1960 අගෝස්තු මස 30 වෙනි දින පෙරවරු 11.30 දක්වා කළුතර දිස්ත්‍රික්කයේ උස්සල්ලාවෙල ඇල අමුන සෑදීම සඳහා රු. 15,000කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් සීල් තබනලද ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. කළුතර වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් අගෝස්තු මස 15 වෙනි දින සිට අගෝස්තු මස 26 වෙනි දින දක්වා ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටැන්ඩර් පත්‍ර ලබා ගැනීමේදී රු. 25ක ටැන්ඩර් තැන්පත් මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට රිසිට් පතක් හෝ වාරි මාර්ග අධ්‍යක්ෂක තුමා නමට රු. 25 මුදල් ඕඩරයක් ඉදිරිපත් කල යුතුයි.

3. ඕනෑම ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීම රජය සතුය.

4. වැඩි විස්තර කළුතර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් විමසන්න.

ඊ. රණසිංහ,
කළුතර වාරිමාර්ග ඉංජිනේරු තැන.

1960 ජූලි මස 25 වැනි දින,
වාරිමාර්ග කාර්යාලය,
කළුතර.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ කොටා රෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960 අගෝස්තු මස 30 වෙනි දින පෙරවරු 11.30 දක්වා කළුතර දිස්ත්‍රික්කයේ රත්හින්ගෙ ඇල සුළු ගංවතුර වැලක්වීමේ ව්‍යාපාරයේ වැඩ සඳහා රු. 25,000කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් සීල් තබන ලද ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. කළුතර වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් අගෝස්තු මස 15 වෙනි දින සිට අගෝස්තු මස 26 වෙනි දින දක්වා ටැන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. ටැන්ඩර් පත්‍ර ලබා ගැනීමේදී රු. 25ක ටැන්ඩර් තැන්පත් මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට රිසිට් පතක් හෝ වාරිමාර්ග අධ්‍යක්ෂක තුමා නමට රු. 25ක මුදල් ඕඩරයක් ඉදිරිපත් කළ යුතුයි.

3. ඕනෑම ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ සියළුම ටැන්ඩර් ප්‍රතික්ෂෙප කිරීම රජය සතුය.

4. වැඩි විස්තර කළුතර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් විමසන්න.

ඊ. රණසිංහ,
කළුතර වාරිමාර්ග ඉංජිනේරු තැන.

1960 ජූලි මස 25 වැනි දින,
වාරිමාර්ග කාර්යාලය,
කළුතර.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ කොටා රෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960 අගෝස්තු මස 30 වෙනි දින පෙරවරු 11.30 දක්වා කළුතර දිස්ත්‍රික්කයේ මීගම මූනමල්වත්ත කරදිය වැලක්වීමේ ව්‍යාපාරයේ ඕවර්සියර් නිවාසයක් තැනීම සඳහා රු. 20,000 කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් සීල් තබන ලද ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. කළුතර වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් අගෝස්තු මස 15 වෙනි දින සිට අගෝස්තු මස 26 වෙනි දින දක්වා ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටැන්ඩර් පත්‍ර ලබාගැනීමේදී රු. 25 ක ටැන්ඩර් තැන්පත් මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට රිසිට් පතක් හෝ වාරිමාර්ග අධ්‍යක්ෂකතුමා නමට රු. 25 ක මුදල් ඕඩරයක් ඉදිරිපත් කළ යුතුයි.

3. ඕනෑම ටැන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ සියළුම ටැන්ඩර් ප්‍රතික්ෂෙප කිරීම රජය සතුය.

4. වැඩි විස්තර කළුතර වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් විමසන්න.

ඊ. රණසිංහ,
වාරිමාර්ග ඉංජිනේරුතැන.

වාරිමාර්ග කායඝාලය,
කළුතර, 60. 8. 2.

## වාරිමාගී දෙපාර්තමේන්තුව

කොළඹ කොටා රෝඩ් හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන විසින් සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ හිඳල්ලන ඕවර්සියර් වගීයේ නිවාසයක් තැනීම සඳහා 1960. 9. 6 වෙනි අඟහරුවාදා පෙරවරු 11.30 වන තුරු ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

රත්නපුර වාරිමාගී කාර්යාලයයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍ර වල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවර වල බහා ඉදිරිපත් කළ යුතුයි. සැලැස්ම හා වැඩ පිළිබඳ විස්තර රත්නපුර වාරිමාගී කාර්යාලයයෙන් ලබා ගත හැක.

වාරිමාගී දෙපාර්තමේන්තුවේ රු. 20,000කට හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචි වී ඇති රු. 25ක් ටෙන්ඩර් සඳහා කච්චේරියේ තැන්පත් කළ බැව් පෙන්වා සිටින කොන්ත්‍රාත්කරුවන්ට 60.8.12 වෙනි දින සිට 60. 9. 3 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

දැනට රජයේ කොන්ත්‍රාත් කරමින් සිටින කොන්ත්‍රාත්කරුවන් විසින් එම වැඩ සතුටුදායක අන්දමින් කෙරීගෙන යන බවට ඒවා භාර නිලධාරීන්ගෙන් ලබා ගත් සහතිකයක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේ දී ඉදිරිපත් කළ යුතුයි.

කරුණු නොවිමසා එකක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේ හෝ යම් ටෙන්ඩරයක යම් කොටසක් පිළිගැනීමේ හෝ අයිතිය රජය සතුයි.

සී. කණගසුන්දරම්,
රත්නපුර උප කොටස භාර
වාරිමාගී ඉංජිනේරු තැන.

## වාරිමාගී දෙපාර්තමේන්තුව

කොළඹ 8, කෝට්ටේ පාරේ, බටහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තුමා විසින් පහත දැක්වෙන එක් එක් වැඩ සඳහා ඒ වැඩය ඉදිරිපසින් දැක්වෙන ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට වාරිමාගී දෙපාතීමේන්තුවේ ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් 1960 සැප්තැම්බර් මස 6 වෙනි දින පෙරවරු 11.30 දක්වා සීල් තැබූ ටෙන්ඩර් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ ලියාපදිංචි කළ තැපැලෙනි. ලියුම් කවරයේ වම් කෙළවරෙහි පැහැදිලිව වැඩයේ නම සඳහන් කළ යුතුයි. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර, කොළඹ 8, කෝට්ටේ පාරේ ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු කායඝාලයයේ ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි.

1. වාරිමාගී දෙපාතීමේන්තුවේ රත්මලානේ කටුබැද්දේ ගබඩාවට යෑම සඳහා තාර පාරක් සෑදීම. (රු. 8,500).
2. රත්මලානේ වාරිමාගී දෙපාතීමේන්තුවේ යාන්ත්‍රික අංශයේ ගබඩාව වටේ අඩි 20ක් පළල තාර පාරක් තැනීම රු. 19,500.

කොළඹ 5 ජාවත්ත පාරේ පිහිටි ගොඩනැගිලි උප කොට්ඨාශය භාර වාරිමාගී ඉංජිනේරු තැනගේ කායඝාලයෙන් 1960 සැප්තැම්බර් මස 2 වෙනි දින පස්වරු 4.30 දක්වා ලබාගත හැකි ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනුපිටපතක් ද සමගය. සැලැස්ම හා වැඩි විස්තර මෙහිදී බලාගත හැකිය.

ඕනෑම කච්චේරියක හෝ පහත සඳහන් කායඝාලයයේ හෝ රු. 25 තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කර තමාගේ ලියාපදිංචිය ඔප්පු කරන අයට පමණක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

දැනට රජයේ කොන්ත්‍රාත් වැඩ ලබා සිටින ටෙන්ඩර් කරුවන් එම වැඩය සතුටුදායක අන්දමින් කරගෙන යන බවට එම වැඩය භාරගත් නිලධාරීන්ගෙන් ලබාගත් සහතිකයක් ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමේදී ඉදිරිපත් කළ යුතු යි.

වී. කුමාරසවාමි,
ගොඩනැගිලි උප කොට්ඨාශය භාර
වාරිමාගී ඉංජිනේරු තැන.

වාරිමාගී ඉංජිනේරු කායඝාලයය,
ගොඩනැගිලි උප කොට්ඨාශය,
ජාවත්ත පාර, කොළඹ 5,
1960 අගෝස්තු මස 3 වැනි දින දීය.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ. 8. කෝට්ටේ පාරේ, බටහිර කොට්ඨාශය භාර ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් පහත දක්වෙන එක් එක් වැඩය සඳහා, ඒ වැඩය ඉදිරි පසින් දක්වෙන ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960 සැප්තැම්බර් මස 6 වෙනි දින පෙරවරු 11.30 දක්වා සීල් තැබූ ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ ලියා පදිංචි කළ තැපැලෙනි. ලියුම් කවරයේ වම් කෙළවරෙහි පැහැදිලිව වැඩයේ නම සඳහන් කළ යුතුයි. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 8, කෝට්ටේ පාරේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයයේ ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි.

1. ජාවත්තේ වාරිමාර්ග කාර්යාලයට අමතර පාරක් තැනීම (රු. 17,500)
2. ජාවත්තේ වාරිමාර්ග කායඝාලයට අමතර ගරාජයන් තැනීම (රු. 6,800)

කොළඹ. 5, ජාවත්තපාරේ පිහිටි ගොඩනැගිලි උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් 1960 සැප්තැම්බර් මස 2 වෙනි දින පස්වරු 4.30 දක්වා ලබාගත හැකි ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනුපිටපතක් සමගය. වැඩි විස්තර හා සැලැස්ම එහිදී බලාගත හැකිය.

ඕනෑම කච්චේරියක හෝ පහත සඳහන් කාර්යාලයයේ හෝ එක් එක් වැඩය සඳහා රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග තම සුදුසුකම් ඉදිරිපත් කරන අයට පමණක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

දැනටමත් රජයේ කොන්ත්‍රාත් වැඩ ලබා තිබෙන අය එම වැඩය සතුටුදායක අන්දමින් කරගෙන යන බවට එම වැඩය භාර නිළධාරීන් ගෙන් ලබාගත් සහතිකයක් ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමේදී ඉදිරිපත් කළ යුතුයි.

වී. කුමාරස්වාමි,
වාරිමාර්ග ඉංජිනේරු තැන.

ගොඩනැගිලි උප කොට්ඨාශය භාර
වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයය,
ජාවත්ත පාර, කොළඹ. 5.
1960 අගෝස්තු මස 5 වෙනි දිනදීය.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තංගල්ලේ දකුණු කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තුමා විසින් හම්බන්තොට උප කොට්ඨාශයෙහි තංගල්ලේ ඕවසියර් වර්ගයේ නිවාසයක් සෑදීම සඳහා 1960 අගෝස්තු මස 30 වන දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ හම්බන්තොට උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉන්ජිනේරුතුමාගෙන් ලබාගත් පෝරමවලය. වැඩිදුර කරුණු සඳහා හම්බන්තොට උපකොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් විමසන්න, නැතහොත් 60. 8. 3 දින දරණ ටැන්ඩර් කැඳවීමේ දැන්වීම බලන්න.

3. රු. 17,000 කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ බවට සාක්ෂි ඉදිරිපත් කළ කොන්ත්‍රාත් කරුවන්ට 60.8.12 දින සිට 60.8.26 දින පස්වරු 4.30 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරණු ලැබේ. ටෙන්ඩර් පෝරම නිකුත්කරණු ලබන්නේ සෑම ටෙන්ඩරයක් සඳහාම රු. 25 ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. මෙම මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැක.

වෝ. ල. ද සි. ආදිහෙට්ටි,
වාරිමාර්ග ඉංජිනේරු තුමා,
හම්බන්තොට උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය,
හම්බන්තොට,
60.8.3.

## වාරිමාගී දෙපාර්තමේන්තුව

වයඹ පළාතේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 60.10.1 සිට 61.9.30 දක්වා වූ මුදල් වර්ෂය තුල මාහෝ දුම්රිය ස්ථානයේ සිට නිකවැරටියේ වාරිමාර්ග කාර්යාලයේ බඩු ගබඩාවට සහ එහි සිට වැඩ පළවල් වලට බඩු බාහිරාදිය ගෙන යාම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 10,000කට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960 සැප්තැම්බර් මස 7 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

1960 සැප්තැම්බර් මස 5 වෙනි සඳුදා පස්වරු 4.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර හා ඒ පිළිබඳ වැඩි විස්තර නිකවැරටිය උප කොට්ඨාශය භාර වාරි මාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක. ටෙන්ඩර් පත්‍ර

නිකුත් කරනු ලබන්නේ මෙම දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් විසින් රුපියල් 25ක මුදලක් කච්චේරියක හෝ මෙම කාර්යාලයේ තැන්පත් කිරීමෙන් පසුවය.

ආල්. බී. ඇම්. ප්‍රනාන්දු,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
නිකවැරටිය උ. කො.

වාරිමාර්ග කාර්යාලය,
නිකවැරටිය, 1960.8.2.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වාගොල්ලේ කෘෂිකර්ම ප්‍රායෝගික පාඨශාලාවට කාර්මික වැඩපොලක් සෑදීම සඳහා ගොඩනැගිල්ලක්

පේරාදෙණියේ ගන්නොරුවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වාගොල්ලේ පිහිටි ප්‍රායෝගික කෘෂිකර්ම පාඨශාලාවේ කාර්මික වැඩ පොළක් සෑදීම සඳහා ගොඩනැගිල්ලක් තැනීමට ටෙන්ඩර් පත්‍ර 1960 සැප්තැම්බර් 2 වැනි දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. කෑගල්ලේ කෘෂිකර්ම කායසීලයේ, කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් ද සහිතව ලියුම් කවරයක දමා සීල් තබා ඒ කවරයේ " සභාපතිතුමා, ටෙන්ඩර් මණ්ඩලය, ඉංජිනේරු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගන්නොරුව, පේරාදෙණිය " යන්න ලියා එහි මුදුනේ වම් කෙළවරේ " වාගොල්ලේ කෘෂිකර්ම ප්‍රායෝගික පාඨශාලාවට කාර්මික වැඩ පොළක් සෑදීම සඳහා ටෙන්ඩර් " යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. රිජිස්ටර් තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට බලය දී තිබෙන නිලධාරි තැන වූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ පරිපාලන නිලධාරි තැනට භාරදිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයෙහි " වාගොල්ලේ කෘෂිකර්ම ප්‍රායෝගික පාඨශාලාවට කාර්මික වැඩ පොළක් සෑදීම සඳහා ටෙන්ඩර් " යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රිජිස්ටර් තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණ බව ඒවා විවෘත කරන දිනයේදීම සියළුම ටෙන්ඩර්කරුවන් වෙත දන්වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත නොලැබුනේ නම් ඒ ගැන පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම විමසිය යුතුය.

5. මෙම ගොඩනැගිල්ල සඳහා රුපියල් 8,000 කට වඩා ආණ්ඩුවේ ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් 1960 අගෝස්තු 10 වැනි දින දවල් 12 වන තෙක් (සතියේ දිනවල පස්වරු 4 දක්වාද සෙනසුරාදා දිනයන්හි පස්වරු 12.30 දක්වාද) එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසු ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. මෙම තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ හෝ කළ හැක. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරගනු ලැබුවා වූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බැව් දන්වා දස දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් ද කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් නියම ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ප්‍රමාණයන් ( ) සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාක්. මෙන්ම, ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තමන්ගේ ලිපිනය පැහැදිළි අකුරෙන් ලියා එවිය යුතුයි.

8. ටෙන්ඩර්කරුවන් කෑගල්ලේ, කෘෂිකර්ම කායසීලයේ, කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් මෙම ගොඩනැගිල්ලේ ප්ලෑන්, එහි දිග, පළල යනාදිය සහ පොරොන්දු පත්‍ර පිළිබඳ වැඩි විස්තර ලබා ගත යුතුයි. සෑම ටෙන්ඩර්කරුවෙක්ම මේ ගොඩනැගිල්ල සෑදීමට අදහස් කරන ස්ථානය ප්‍රථමයෙන් බලා ටෙන්ඩර් පත්‍ර යැවීම යෙහෙකි.

9. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද වැඩයෙහි මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂතැනගේ නමින් තැන්පත් කිරීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත්, පත් කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවී තුන් මසක් ඇතුළත කොන්ත්‍රාත්කරුවාගෙන් යම්කිසි මුදලක් අය කර ගැනීමට නොතිබුණොත් පමණකි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවටද ඇතුළත් කරනු ලැබේ.

10. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වූ දින සිට සති හයක් යනතුරු ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

12. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර හෝ ප්‍රතික්ෂේප කිරීමටද, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමට ද බලය ආණ්ඩුව වෙත තබාගනු ලැබේ.

13. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩට ලාංකික කම්කරුවන් ගැනීමට පත්කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. " ලාංකිකයා " යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිකරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

14. තමාගේ යම්කිසි සේවකයකුගේ හෝ සේවකයෙකු වෙනුවෙන් 1934ජේ 19 වැනි අංක දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වෙනි පරිච්ඡේදය) යටතේ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. මෙම ගොඩනැගිල්ල සෑදීමට තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් හැකිතාක් දුරට එම වැඩය කරගෙන යාමට වුවමනා කරන නුපුහුණු හා පුහුණු කම්කරුවන් එම ප්‍රදේශයෙන්ම බඳවා ගැනීමට පොරොන්දු විය යුතු අතර, එය පැහැර හැරියේ නම් ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරන අතර ඔහුගේ වැඩ තහනම් කරනු ලැබේ. තවද, යම්කිසි අවස්ථාවක වැළැක්විය නොහැකි කරුණු කරණකොටගෙන මෙයින් වැළකීමට බලය කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තුමාගෙන් ලියවිල්ලකින් ලබාගත යුතුයි. මෙය කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමාගේ මාර්ගයෙන් ලබාගත යුතුයි. ලාංකික නොවූ කම්කරුවන් හෝ එම ප්‍රදේශයෙන් බැහැර කම්කරුවන් මේ වැඩ කටයුතු සඳහා යෙදීම කොන්ත්‍රාත්තුව පැහැර හැරියා ලෙස සලකනු ලැබේ. කොන්ත්‍රාත්කරුවා කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විසින් බලය දෙන ලද නිලධාරියෙකුට ඔහුගේ පොත්, චැක්රෝල් යනාදිය බැලීමට අවසර දිය යුතුයි.

16. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට භාර දුන්නොත් නැතහොත් ඔහුගේ ලිපිනයට තැපැලෙන් යැවුවහොත් එසේත් නැතහොත් ඔහු ලියා දී තිබෙන ස්ථානයට ගෙන ගොස් දුන්නොත් ඔහුට භාරදුන්නා කොට සැලකිය යුතුයි.

17. කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් සේවයට නුසුදුසු යයි නිගමනය කරන ලද කම්කරුවන් කොන්ත්‍රාත්කරුවා විසින් සේවයට නොගත යුතුයි.

18. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ඇපකරුවන් දෙදෙනෙකු සොයාගෙන ඔහුගේ වියදමෙන්ම පොරොන්දු පත්‍රයට අත්සන් තැබිය යුතුයි. එම ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් අනුමත කළ යුතුයි.

19. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නමත් සමග නම ඇතුළුවූ හෝ නමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධවන කිසිවකු සමග කොන්ත්‍රාත්තුවට බැඳෙනු නොලැබේ.

20. අසතුටුදායක වැඩ හා කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නොකිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන වෙත තබාගනු ලැබේ.

21. මේ පිළිබඳ වැඩි විස්තර කෑගල්ලේ, දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලයේ, ව්‍යාප්ත නිලධාරිතැනගෙන් ලබාගත යුතුයි.

ඒ. වී. රිචඩ්ස්,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 අගෝස්තු මස 2 වැනි දින,
පේරාදෙණියේ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වව්නියාවේ ගොවිපලට පොල් අතු සැපයීම

වව්නියා දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිළධාරීතැන විසින් පහත සඳහන් ස්ථානවලට පොල් අතු සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 අගෝස්තු මස 26 දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ.

**පොල් අතු 6,000ක් සැපයීම හා භාරදීම**

1. පුං ගව මධ්‍යස්ථානය, නනත්තන් 3,000
2. පුං ගව මධ්‍යස්ථානය, මන්නාරම 1,000
3. මුරුන්කන් ගොවිපල 2,000

අවශ්‍යතාවයන් :—එක් ඉරුවක් දිග අඩි 6කට නොඅඩු වූ ද වියන ලද පළල අඟල් 18 කට නොඅඩු වන් තිබිය යුතුයි. සැපයීම හා භාරදීම 1960. 8. 31 දිනට පෙර කළ යුතුයි.

2. වව්නියා කෘෂිකර්ම කාර්යාලයේ දිස්ත්‍රික් කෘෂි ව්‍යාප්ති නිලධාරි තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් සහිතව ලියුම් කවර යක බහා, සීල් තබා "සභාපති ටෙන්ඩර් මණ්ඩලය, දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති කායාසීලය, වව්නියා" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙළවරෙහි "වව්නියා දිස්ත්‍රික් ගොවිපොළවලට පොල් අතු සැපයීමේ ටෙන්ඩර්" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සි යක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 7ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්වද ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නො එවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් වව්නියා දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "වව්නියා දිස්ත්‍රික් ගොවිපොළවලට පොල් අතු සැපයීමේ ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු වව්නියා දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරිතැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී වව්නියා දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති කායාසීලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍ර යක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළ හොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද, පිළිගනු ලැබුවාවූද දේවල මුළු ගණනින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තුමාගේ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කර නිමවූ විට පමණකි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවා ද ඇත.

9. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3කටවත් වෙනස් නොවන සපිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්‍ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළි ගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ වෙත තබා ගනු ලැබේ.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කාර්ය සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම්, පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක් වූ තැනැත්තෙක් ය යන්නයි.

13. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

14. වර්ෂ 1934රේ, 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥා පනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවක යෙකු විසින් හෝ සේවකයෙකු වෙනුවෙන් හෝ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීම නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තුමා විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නො ලැබේ.

17. වැඩි විස්තර වව්නියා, කෘෂිකර්ම කාර්යාලයේ දී කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් දැනගත හැක.

ඒ. වී. රිචඩ්ස්,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්‍ෂ.

1960 අගෝස්තු මස 2 වැනි දින,
පේරාදෙණියේ දී ය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කුරුණෑගල මල්ලවපිටියේ දිස්ත්‍රික් කෘෂිකර්ම කායාසීලයේ (කුරුණෑගල සහ පුත්තලම් දිස්ත්‍රික්ක භාර) පරිපාලන නිලධාරි තැන විසින් **මාරාවිල සතුන් බෝකිරීමේ** මධ්‍යස්ථානයට පහත දක්වෙන දේවල් සැපයීම සහ ගෙනගොස් බාරදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර්පත්‍ර 1960 අගෝස්තු මස 31 දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ :—

(1) පුළුස්සන ලද ගඩොල් 25,000, සාමාන්‍ය ප්‍රමාණය (ආණ්ඩුවේ පිළිගත්)

(2) වියන ලද පොල් අතු 4,000, දිග අඩි 6 පළල අඩි 1.

මේ එක් එක් ද්‍රව්‍ය සැපයීම සඳහා වෙන වෙනම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

2. කුරුණෑගල මල්ලවපිටියේ දිස්ත්‍රික් කෘෂිකර්ම කායාසීලයේ (කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර) පරිපාලන නිලධාරි තැන ගෙන් පෝර්ම කොළ ලබාගෙන ඒවායෙහි ටෙන්ඩර් පත්‍ර එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක්ද සහිතව ලියුම් කවරයක දමා සීල් තබා "කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරි තැන, දිස්ත්‍රික් කෘෂිකර්ම කායාසීලය, මල්ලවපිටිය, කුරුණෑ ගල" යන්න එහි පිට ලියා එහිම මුදුන් වම් කෙළවරෙහි "මාරාවිල සතුන් බෝකිරීමේ මධ්‍යස්ථානයට ගඩොල්/පොල් අතු සැපයීම හා ගෙනගොස් භාරදීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නො එවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් කුරුණෑගල මල්ලවපිටියේ කෘෂිකර්ම කායාසීලයේ (කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර) පරිපාලන නිලධාරි තැනට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයේ "මාරාවිල සතුන් බෝකිරීමේ මධ්‍යස්ථානයට ගඩොල්/පොල් අතු සැපයීම හා ගෙනගොස් භාරදීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියළුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුලත යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබු ණොත් ඔහු පරිපාලන නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් (දහයක්) තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවයි. මේ තැන්පත් කිරීම කච්චේරි යක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින දහයක් ඇතුලත අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වන්නටද ඉඩ තිබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති හෝ නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවත් හැර ඒවා සම්බන්ධ යෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තුමාගෙන් ලිය විල්ලකින් ලබාගත යුතුයි. මෙය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තුමාගේ මාර්ගයෙන් ලබාගත යුතුයි. ලාංකික නොවූ කම්කරුවන් හෝ එම ප්‍රදේශයෙන් බැහැර කම්කරුවන් මේ වැඩ කටයුතු සඳහා යෙදීම කොන්ත්‍රාත්තුව පැහැර හැරියාකොට සලකනු ලැබේ. තවද කොන්ත්‍රාත්කරුවා විසින් කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තුමා විසින් බලය දෙන ලද නිලධාරියෙකුට ඔහුගේ පොත්, චැක්රෝල් යනාදිය බැලීමට අවසර දිය යුතුයි.

16. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දන්වීම් ඔහුගේ අතට භාර දුන්නොත් නැතහොත් ඔහුගේ ලිපිනයට තැපැලෙන් යැවුව හොත් එසේත් නැතහොත් ඔහු ලියා දී තිබෙන ස්ථානයට ගෙන ගොස් දුන්නොත් ඔහුට භාර දුන්නා කොට සැලකිය යුතුයි.

17. කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැන විසින් සේවයට නුසුදුසු යයි නිගමනය කරණ ලද කම්කරුවන් කොන්ත්‍රාත්කරුවා විසින් සේවයට නොගත යුතුයි.

18. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ඇප කරුවන් දෙදෙනෙකු සොයාගෙන ඔහුගේ වියදමෙන්ම පොරොන්දු පත්‍රයට අත්සන් තැබිය යුතුයි. එම ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කළ යුතුයි.

19. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නමත් සමග නම ඇතුලුවූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැන විරුද්ධවන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැදෙනු නොලැබේ.

20. අසතුටුදායක වැඩ හා කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටුනොකිරීමක් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැන වෙත තබාගනු ලැබේ.

21. මේ පිළිබඳ වැඩි විස්තර කුරුණෑගල සහ පුත්තලම් දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරි තැනගෙන් හෝ පුත්තලමේ කෘෂිකර්ම ව්‍යාප්තිය නිලධාරි තැනගෙන් හෝ ලබාගත යුතුයි.

ඒ. වී. රිචර්ඩ්ස්,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්‍ෂ.

1960 අගෝස්තු මස 3 වැනි දින,
පේරාදෙණියේ දීය.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**මහනුවර දිස්ත්‍රික්කයේ මිනිපේ ඇල දික්කිරීමේ ව්‍යාපාරයේ සහ කුන්ඩසාලේ ගොඩනැගිලි සඳහා බඩුබාහිරාදිය සැපැයීම**

මහනුවර ඉඩම් සංවර්ධන නිලධාරිතුමා විසින් මහනුවර දිස්ත්‍රික්කයේ මිනිපේ ඇල දික්කිරීමේ ව්‍යාපාරයේ සහ කුන්ඩසාලේ ගොඩනැගිලි සෑදීම සඳහා අවශ්‍ය පහත සඳහන් බඩු බාහිරාදිය සැපැයීම සඳහා "ටෙන්ඩර්පත්‍ර" 60.8.24 වන දින සවස 2 දක්වා බාරගනු ලැබේ.

(1) පොල් අතු (ඉරුදෙක (2) බැගින් වියන ලද ඒවා දිගින් අඩි 7ටත් පලලින් අගල් 18ටත් අඩු නොවිය යුතුයි).
(2) කළුගල් (අගල් 6×9 ප්‍රමාණය)
(3) ගඩොල් (අගල් $4\frac{1}{4} \times 2\frac{3}{4} \times 8\frac{3}{4}$)
(4) අළුහුණු (බුසල රාත්තල් 44ට අඩු නොවිය යුතුයි)
(5) තම්බාපු හුනු
(6) කළුගල් 2"
(7) කළුගල් 1"
(8) කළුගල් $\frac{3}{4}$"
(9) කළුගල් $1\frac{1}{2}$"

60.8.20 වන දින දවල් 12 දක්වා මහනුවර ඉඩම් සංවර්ධන නිලධාරි තැනැගේ කායඞාලයෙන් ලබාගත හැකි "ෆෝර්මකොල" වල "ටෙන්ඩර්පත්‍ර" ලියා අනුපිටපතකුත් සහිතව ඉදිරිපත් කළයුතුයි. කච්චේරියක රුපියල් 50ක ඇපමුදලක් තැන්පත් කොට ලබාගත් කුයිතාන්සියක් ඉදිරිපත් කොට ටෙන්ඩර් පත්‍රිකා ලබාගත යුතුයි.

60.8.24 වන දින සවස 2.30ට ඉඩම් සංවර්ධන නිලධාරිතැනගේ කායඞාලයේදී ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් ටෙන්ඩර් කරුවනට මෙම අවස්ථාවේදී පැමිණ සිටිය හැක.

මේ ගැන වැඩිවිස්තර මහනුවර ඉඩම් සංවර්ධන නිලධාරිතැනගේ කායඞාලයෙන් දැනගත හැක.

කේ. බී. රත්නායක,
ඉඩම් සංවර්ධන නිලධාරි තුමා.

1960 ජූලි 25 වන දින,
ඉඩම් සංවර්ධන කායඞාලය,
මහනුවර.

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

බදුල්ල ඉඩම් සංවර්ධන නිලධාරිතැන විසින් බදුලු දිස්ත්‍රික්කයේ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රමයන්හි ගොඩනැගිලි සෑදීමට අවශ්‍ය පහත සඳහන් බඩු බාහිරාදිය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 අගෝස්තු 31 වැනි දින දවල් 12 වන තෙක් බාරගනු ලැබේ:—

(1) පොල් අතු, ඉරු දෙක බැගින් වියන ලද ඒවා. (දිගින් අඩි 7ක් හා පළලින් අඩි $1\frac{1}{2}$ක් විය යුතුය).
(2) කළුගල් (තලාපු), අගල් 6" × 9" ප්‍රමාණ විය යුතුය. (කියුබ් ගණනින්)
(3) පුච්චාපු ගඩොල් ($4\frac{1}{4}$" × $2\frac{3}{4}$" × $8\frac{3}{4}$" විය යුතුය).
(4) කළුගල් (1" × $\frac{3}{4}$" × 2" කියුබ් ගණනින්).
(5) අමු පොල් අතු
(6) අළුහුණු. (සුඩ කරන ලද අළුහුණු හා තම්බාපු හුණු) බුසල රාත්තල් 44 ට අඩු නොවිය යුතුය.

1960 අගෝස්තු මස 17 වැනි දින දවල් 12 දක්වා බදුල්ල ඉඩම් සංවර්ධන කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝරම කොළවල ටෙන්ඩර් පත්‍ර ලියා, අනුපිටපතකුත් සහිතව ඉදිරිපත් කළ යුතුයි. බදුල්ල ඉඩම් සංවර්ධන කායඞාලයේ හෝ කච්චේරියේ රු. 50 ක ඇප මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කොට ටෙන්ඩර් පත්‍ර ලබාගත යුතුය.

1960 අගෝස්තු 31 වැනි දින පස්වරු 2 ට බදුල්ල ඉඩම් සංවර්ධන කාර්යාලයේදී විවෘත ටෙන්ඩර් කරනු ලැබේ. අවශ්‍ය නම් ටෙන්ඩර් කරුවන්ට මේ අවස්ථාවේදී පැමිණ සිටිය හැක.

මේ ගැන සම්පූර්ණ විස්තර බදුල්ල ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කායඞාලයෙන් ලබාගත හැක.

පී. සන්ගරවේල්,
ඉ. ස. නිලධාරි,
බදුල්ල.

1960 ජූලි 27,
ඉඩම් සංවර්ධන කායඞාලය,
කච්චේරිය,
බදුල්ල.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**1960-61 මුදල් වර්ෂයේ පළමුවෙනි කොටසට මාන්කුලම් ඉඩම් සංවර්ධන නිලධාරි තැන යටතේ ඇති ව්‍යාපාරවලට ගොඩනැගිලි උපකරණ සැපයීම**

මාන්කුලම් ව්‍යාපාරයේ ඉඩම් සංවර්ධන නිලධාරි තැන විසින් 1960 සැප්තැම්බර් 2 වෙනි සිකුරාද දහවල් 12 දක්වා පහත සඳහන් ව්‍යාපාරවලට පහත සඳහන් ගොඩනැගිලි උපකරණ සඳහා ටැන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

(1) වවුනිකුලම් ව්‍යාපාරය
(2) පාවට්කුලම් ව්‍යාපාරය
(3) පෙරියකාඩි විරිච්චන්කුලම් ව්‍යාපාරය.
(4) කිරාන්චි ව්‍යාපාරය
(5) ආනන්දපුරම් ව්‍යාපාරය.

**ගොඩනැගිලි උපකරණ :**

(1) ගඩොල්—ප්‍රමාණය $4\frac{1}{2}$" × $2\frac{1}{4}$" × $8\frac{3}{4}$"
(2) පොල් අතු—ඉරු දෙක බැගින් වියන ලද ඒවා අඩි 7ට වඩා කෙටි නොවිය යුතුයි. පළලින් අඩි $1\frac{1}{2}$ ට වඩා අඩු නොවිය යුතුයි.
(3) තම්බාපු හුණු—මිටිවලින් (බුසලේ)
(4) අළු හුණු—බුසලෙ මිටි වලින්
(5) කළු ගල්— (6" × 9") කියුබ් ගණනින්
(6) තලාපු ගල්— $\frac{3}{4}$"; $1\frac{1}{2}$" සහ අඟ. 2 කියුබ් ගණනින්.

2. ටෙන්ඩර් පත්‍ර ෆෝර්ම කොලවල පුරවා අනු පිටපතකුත් සමග එවිය යුතුයි. මේ ෆෝර්ම කොල මාන්කුලම් ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාර්යාලයෙන් අගෝස්තු 26 වන දින දහවල් 12 දක්වා ලබා ගත හැක.

මේ සඳහා රු. 50ක ඇප මුදලක් ඉහත සඳහන් ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාර්යාලයේ හෝ කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර ලබා ගත හැක.

3. 1960 සැප්තැම්බර් 2 වෙනි සිකුරාද සවස 3 ට ටෙන්ඩර් පත්‍ර මාන්කුලම් ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් මේ අවස්ථාවේදී පැමිණ සිටිය හැක.

4. මේ සඳහා වැඩි විස්තර ආදියක් අවශ්‍ය නම් මාන්කුලම් ඉඩම් සංවර්ධන නිලධාරි තැනගෙන් ලබා ගත හැක.

පී. වී. නල්ලනායගම්,
ඉඩම් සංවර්ධන නිලධාරිතැන,
මාන්කුලම.

1960 ජූලි 25.

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ (කොළඹ 1) ඉඩම් සංවර්ධන නිලධාරි තැන විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ දෙල්ගොඩ, මඩලගම හා කරවිට යන ව්‍යාපාරයන්ට ද බලන්ගොඩ දිස්ත්‍රික්කයේ උග්ගල්කල්තොට ව්‍යාපාරයට ද කොළඹ දිස්ත්‍රික්කයේ කොටුවේ හා කිරුළපොනෙහි පිහිටි දෙපාර්තමේන්තු ගොඩනැගිලි තැනීම සඳහා ද පහත සඳහන් ගොඩනැගිලි උපකරණ සඳහා 1960. 8. 29 දින පෙරවරු 11 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

1. පොල් අතු (අඩි 7ක් දිගින් හා අඟල් 12ක් පළලින් අඩුනොවූ ඉරූ දෙකේ අතු 1,000 බැගින්).
2. පිළිස්සූ හුණු (බුසලක් බරින් රාත්තල් 44ට අඩු නොවිය යුතුයි.)
3. තැම්බූ හුණු (බුසල් ගණනින්)
4. 6″ × 9″ ගල් කැබලි (කියුබ් ගණනින්)
5. 2″ කපාපු කළුගල් (කියුබ් ගණනින්)
6. ¾″ කපාපු කළුගල් (කියුබ් ගණනින්)
7. 1½″ කපාපු කළුගල් (කියුබ් ගණනින්)
8. 1″ කපාපු කළුගල් (කියුබ් ගණනින්)
9. ½″ කපාපු කළුගල් (කියුබ් ගණනින්)
10. ¼″ කපාපු කළුගල් (කියුබ් ගණනින්)
11. පිළිස්සූ ගඩොල් (ප්‍රමාණය 8¾″ × 4¼″ × 2¾″) 1000 බැගින්. (පෝරණුව ව්‍යාපාරයේ සිට සැතපුම් 5ක් ඇළත විය යුතුයි)

2. භාරදීම සඳහා වෙන වෙනම ගණන් ගිලව් සඳහන් කළ යුතුයි.

(අ) වත්තෙන් / පෝරණුවෙන් / ගල්වලෙන් (ස්ථානය කරා ලොරි ගෙන යා හැකි විය යුතුයි)

(ආ) ව්‍යාපාරයට ගෙනැවිත් භාරදීමට.

3. අනුමත කරණ ලද ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කිරීමට මත්තෙන් ටෙන්ඩර් කරුවන් විසින් මෙම කාර්යාලයේ හෝ කොළඹින් බැහැර කච්චේරියක එකිනෙක ව්‍යාපාරයන් සඳහා රු. 50 බැගින් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

4. සියලුම ටෙන්ඩර් වල ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම ඒ ඒ ව්‍යාපාරයන් සඳහා වෙන වෙනම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. පිට කවරයෙහි "දෙල්ගොඩ හෝ කරවිට ව්‍යාපාරයන්ට ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් ව්‍යාපාරයේ නම සඳහන් කොට ලියාපදිංචි කළ තැපැලෙන් ඉඩම් සංවර්ධන නිලධාරිතුමා, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි.

5. සාර්ථකවූ ටෙන්ඩර් කරුට දැන්වූ දින සිට සති දෙකක් ඇතුලතදී තමාගේ ටෙන්ඩරය පරිදි උපකරණ සැපයිය යුතුයි. යම් හෙයකින් ටෙන්ඩර් කරු සැපයීම ප්‍රතික්ෂෙප කොට හෝ පැහැර හැරියහොත් ඔහුගේ නම රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට අඩංගුවෙනවා පමණක් නොව ඊට පසු ඔහුට රජයේ කිසිම කොන්ත්‍රාත්තුවකට බැඳීමට ද නුසුදුසුවන්නේ ය.

6. 60. 8. 29 දින පෙරවරු 11.15ට ටෙන්ඩර් විවෘත කරන නිසා කැමැති ටෙන්ඩර් කරුවන්ට එකී අවස්ථාවේදී පෙනී සිටිය හැක.

7. ටෙන්ඩරයේ සියල්ලක් හෝ ඉන් කොටසක් ප්‍රතික්ෂෙප කිරීමේ හෝ භාර ගැණීමේ හෝ නිර්දේශයේ පරිදි සැපයීම් අයෝග්‍ය නම් සම්පූර්ණයෙන් ප්‍රතික්ෂෙප කිරීමේ බලයද ප්‍රධාන කාර්යාලයේ ඉඩම් සංවර්ධන නිලධාරි තැන සතුය.

කේ. ජී. ඩී. ඩී. පතිරත්න,
ඉඩම් සංවර්ධන නිලධාරි තැන,
ප්‍රධාන කාර්යාලය.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එවලන් චතුරශ්‍රය,
කොළඹ 1,
60.8.2.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### පොළොන්නරුව දිස්ත්‍රික්කයේ—ගිරිතලේ, මින්නේරිය, ගල්අමුන, යන ව්‍යාපාරයන්හි ගොඩනැගිලි අංශයන් සඳහා බඩුබාහිරාදිය සැපයීම

පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරි තැන විසින් පොළොන්නරුව ප්‍රදේශයේ පිහිටි ඉහත සඳහන් ව්‍යාපාරයන්හි ගොඩනැගිලි වලට අවශ්‍ය පහත සඳහන් බඩුබාහිරාදිය සැපයීම සඳහා වැන්ඩර් පත්‍ර 1960 අගෝස්තු මස 30 වෙනි දින දවල් 12 දක්වා භාර ගනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 1. | ගඩොල් | ... | ප්‍රමාණය 4¼″ × 2¾″ × 8¾″ විය යුතුයි. |
| 2. | පොල් අතු | ... | ඉරූ දෙක බැගින් වියන ලද ඒවා, දිගින් අඩි 7 වත් පළලින් අඩි 1½ වත් නො අඩු විය යුතුයි. |
| 3. | අළු හුණු | ... | බුසල් ගණනින්, බුසලක් රාත්තල් 44 ට නොඅඩු විය යුතුයි. |
| 4. | තම්බාපු හුණු | ... | බුසල් ගණනින් |
| 5. | ගල් කැබලි | ... | කියුබ් ගණනින්, (3″—9″) ප්‍රමාණ විය යුතුයි. |
| 6. | කලාපු ගල් | ... | කියුබ් ගණනින් (¾″ – 1½″ — 1″ – 2″) |

2. 1960 අගෝස්තු 25 වැනි දින දවල් 12 දක්වා පොළොන්නරුව ඉඩම් සංවර්ධන කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝර්ම කොළවල ටෙන්ඩර් පත්‍රිකා ලියා අනුපිටපත් සහිතව ඉදිරිපත් කළ යුතුයි. ඉහත කී ඉඩම් සංවර්ධන නිලධාරිතැනගේ කාර්යාලයේ හෝ කච්චේරියක රු. 50 ක් ටෙන්ඩර් ඇප මුදල් වශයෙන් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍රිකා ලබා ගත හැක.

3. 1960 අගෝස්තු මස 30 වැනි දින දවල් 12 වන තෙක් පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරිතැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍රිකා භාරගනු ලැබේ. අගෝස්තු 31 වැනි දින උදේ 10ට ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන බැවින් අවශ්‍ය නම් මේ අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට පැමිණ සිටිය හැක.

මේ ගැන අවශ්‍ය තවත් විස්තර ආදිය වේ නම් පොළොන්නරුව ඉඩම් සංවර්ධන කාර්යාලයෙන් ලබා ගත හැක.

ස .ජා. හේවාපතිරණ,
ඉඩම් සංවර්ධන නිලධාරිතැන වෙනුවට.
පොළොන්නරුව.

1960 අගෝස්තු මස 3. වැනි දින,
පොළොන්නරුව ඉඩම් සංවර්ධන කාර්යාලයේදීය.

---

## ධීවර දෙපාර්තමේන්තුව

### පිත්තල කුඩු කැබලි (ෂේවිංස්) විකිණීම

මෝදර, ධීවර කර්මාන්ත ශාලාවේ දී, පිත්තල කුඩුකැබලි රාත්තල් 425ක් පමණ විකිණීම සඳහා ටැන්ඩර 1960 අගෝස්තු 26 වැනිදා පෙරවරු 10.30 වනතුරු කොළඹ 3, ගාලු මුවදෙර ධීවර අධ්‍යක්ෂ විසින් බාර ගනු ලැබේ.

පහත අත්සන් කර ඇති අයගෙන් ලබා ගත් ආකෘති පත්‍ර මගින් ටැන්ඩර ඉදිරිපත් කළ යුතුයි.

ටැන්ඩර සඳහා තැන්පත් කළ යුතු මුදල රුපියල් 50කි.

ඩී. ටී. ඊ. ඒ. ද පොන්සේකා,
ධීවර අධ්‍යක්ෂ.

ගාලු මුවදොර,
කොළඹ 3.

---

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

### අඟල් 2කේ ගැල්වනයිස් යකඩ පයිප්ප, ලාම්පු කණු සහ ලාම්පු සැපයීම සහ භාරදීම

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් බඩු සයක් කොලොන්නාවේ පිහිටි ඔහුගේ ගබඩාවට බාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1960ක්වූ සැප්තැම්බර් මස 6 වන අඟහරුවාදා පූ. භා. 10. දක්වා කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 500, කොළඹ) විසින් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කායඨීලයේදී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5ක මුදලක් ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළයුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් ෆෝර්ම වලයි. වර්ෂ 1960 ක්වූ සැප්තැම්බර් මස 2 වන දින වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්‍ෂ 1960ක්වූ සැප්තැම්බර් මස 6 වන අඟහරුවාදා පූ.භා. 10ට ගාලු මුව දොර මහාලේකම් කාර්‍යාලයේ නො. 455හේ කාමරයේ පිහිටි කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරණ අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1960ක්වූ අගෝස්තු 12 වන දින දීය.

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

### දැනට තිබෙන තොගවලින් දීප්ති විකිරණ උපකරණ සැපයීම සහ භාරදීම

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් බඩු සපයා කොලොන්නාවේ පිහිටි ඔහුගේ ගබඩාවට බාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්‍ෂ 1960ක්වූ අගෝස්තු මස 31 වන බදාදා පූ. භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්‍යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝරම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝරම සැපයීමේ ගාස්තුව වන රු. 5හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළයුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝරම වලයි. 1960ක්වූ අගෝස්තු මස 26 වන දින වන තෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

4. වර්‍ෂ 1960 ක්වූ අගෝස්තු මස 31 වන දින පූ. භා. 10ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්‍යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1960ක්වූ අගෝස්තු 12 වන දින දීය.

## මහර ගල්වල පෙදෙසෙහි පොල් ගස්වල පලදාව බදු දීමයි

1960 ඔක්තෝබර් මස 15 වෙනි දින සිට අවුරුද්දක කාල සීමාවක් මහර ගල්වල පෙදෙසෙහි වූ පොල් ගස්වල පලදාව බදු දීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් කොළඹ වරාය කොමසාරිස් තැන විසින් 1960 සැප්තැම්බර් මස 13 වෙනි අඟහරුවාදා පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ.

2. කොළඹ වරාය කොමසාරිස් වරයාගේ කාර්‍යාලයෙහි රු. 25ක මුදලක් තැන්පත් කිරීමෙන් යථෝක්ත කාර්‍යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය.

3. 1960 අගෝස්තු මස 30 වෙනි අඟහරුවාදා පස්වරු 3 දක්වා කාර්‍යාලයෙහි වැඩ කරන වේලාව තුලදී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ඇත.

4. ටෙන්ඩරය පිළිබඳ වූ කොන්දේසි ටෙන්ඩර් පෝර්ම සමග නිකුත් කරනු ලැබේ.

ඒ. ඇස්. කොහොඹන් වික්‍රම,
වරාය කොමසාරිස්.

1960 ජූලි මස 30 වැනි දින,
කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1960 ඔක්තෝබර් 1වනද සිට 1961 සැප්තැම්බර් 30 වනද දක්වා (දින දෙකම ඇතුලත්ව) කාලය තුල, මේ සමඟ ඇති උප ලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන්වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ ගාලු මුවදොර, මහ ලේකම් කාර්‍යාලය යාබද " බී " අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උප ලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ බ්‍රිස්ටල් වීදියේ ඇති ලංකා බැංකුවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

සැ.යු.—කොළඹ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කාර්‍යාලයෙන් ලබාගත හැක.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකළපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාල වලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නො වන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලාබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නො දරණ අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ, " බී " අක්ෂරය දරණ ගොඩනැගිල්ල, මුදල් අංශය, මහලේකම් කාර්යාලය, ගාලු මුවදොර, කොළඹ," කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළයුතු මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ත්මාම ගණකාධිකාරී මහතාට (සැපයීම් සහ කොන්ත්‍රාත්තු) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උප ලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරනලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම් හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර් කරු විසින් පෝර්මයේ " බී " උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි " සී " උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිළ ගණන්ද සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳ පොළේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතීනම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම් කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරනලද මිලගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත් කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර් කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුල ඉඩ කඩ සලසාදෙනු නො ලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගතයුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

එස්. ඥානසේගරම්,
සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ වෙනුවට.

සෞඛ්‍යදෙපාර්තමේන්තුව,
මුදල් අංශය,
ගාලු මුවදෙර,
මහලේකම් කාර්යාලය,
කොළඹ. 8.8.1960.

### උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇපමුදල රු. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය | (5) ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් — සේවකයන්ට — මාළු | මස් | කරවල | එළවළු | නොගෙවන රෝගීන්ට, — මාළු | මස් | කරවල | එළවළු | කිරි (ආහාර) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කලාහේන මාතෘ නිවාසය | 100 | 300 | | 100 | 50 | 50 | 600 | 50 | 50 | 50 | 250 | — |
| බිබිලේගම මාතෘ නිවාසය | 100 | 300 | | — | — | 200 | 400 | — | — | 200 | 350 | — |
| මාරස්සන ග්‍රාමීය රෝහල, සහ මාතෘ නිවාසය | 100 | 800 | | 400 | 350 | 400 | 1,500 | 700 | 750 | 800 | 2,950 | — |
| පන්විල තැන්න ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව | 100 | 600 | 2.9.60 පෙරවරු 10ට | 300 | 100 | 450 | 1,100 | 800 | 750 | 800 | 3,000 | — |
| උඩුවල ග්‍රාමීය ආරෝග්‍යශාලාව | 100 | 600 | | 350 | 350 | 350 | 1,350 | 350 | 350 | 400 | 1,350 | — |
| කොස්හේන මාතෘ නිවාසය | 100 | 300 | | 200 | 200 | 200 | 800 | 150 | 150 | 150 | 650 | — |
| තඹරඹුව මාතෘ නිවාසය | 100 | 300 | | 20 | — | 20 | 50 | 200 | — | 450 | 950 | — |
| කන්දපිට පත්තු මාතෘනිවාසය | 100 | 300 | | 150 | — | 150 | 650 | 300 | — | 250 | 850 | — |
| වැලිගමුව මාතෘ නිවාසය | 100 | 300 | | 100 | 100 | 100 | 300 | 150 | 150 | 150 | 500 | — |

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිටිකිරි සහ සීනි එහා මෙහා ගෙනයාම

(1) 1960 ඔක්තෝබර් 1 වෙනිද සිට 1961 සැප්තැම්බර් 30 වෙනිදයින් අවසන් වන වර්ෂය තුළ මේ සමඟ ඇති උප ලෙඛනයේ ටෙන්ඩර් පිළිබඳ විස්තර දක්වා ඇති පිටි කිරි සහ සීනි, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්ගේ කායඞාලවල සහ ගබඩාවල සිට/සෞඛ්‍ය කායඞාල භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කායඞාල සහ ගබඩාවල සිට/දිස්ත්‍රික් පරිපාලක වරයින්ගේ කායඞාල සහ ගබඩාවල සිට/දුම්රිය ස්ථානවල සිට/පිටිකිරි සහ, සමුපකාර සංගමවල සිට/සීනි, කිරි මධ්‍යස්ථානවලට උප ලේඛනයේ සඳහන් එක් එක් සේවය සඳහා වෙන වෙනම සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර, කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැන විසින් ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම්වලින් බාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උප ලේඛනයෙහි දෙවන ඡෙදයෙහි සඳහන් පරිදි, රු. 100ක තැන්පත් මුදලක්, මා නමට කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ බ්‍රිස්ටල් වීදියේ ඇති ලංකා බැංකුවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

**සැ.යු.**—කොළඹ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කායඞාලයෙන් ලබාගත හැක.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කායඞාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර ,මාතලේ, පුත්තලම, රත්නපුරය සහ ව්වුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කායඞාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නො වන මොනම ටෙන්ඩරයක් වත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල්තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලා සනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නො දරණ අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නො හැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙය දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමග ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ල, මුදල් අංශය, මහලේකම් කායඞාලය, ගාලුමුවදෙර, කොළඹ" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන්ම, එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරු ගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කායඞාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමා ම ගණකාධිකාරී මහතාට (සැපයීම් සහ කොන්ත්‍රාත්) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උප ලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි, පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩර්යක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙළ කර ගැනීම හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිතයකු ගේ අනුමැතිය ඇතිව හෝ ඒවා යේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නො වේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් හැර පිළිපැදිය යුතු ද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දන ගැනීම සඳහා මෙහි දෙවන ඡෙදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

සෞඛ්‍යසේවා දෙපාර්තමේන්තුව,
මුදල් අංශය, ගාලුමුවදෙර,
මහලේකම් කාර්යාලය,
කොළඹ, 8.8.1960.

එස්. ඥානසේගරම්,
සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ වෙනුවට.

## ඉහත සඳහන් උපලේඛනය

